# කාර්ය සාධන වාර්තාව - 2017

## ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව


**1.** දැක්ම, මෙහෙවර, කාර්යයන් සහ වගකීම්

**2.** දෙපාර්තමේන්තුවේ ඒකක සහ අංශ

**3.** ආංශික කාර්යය සාධනය

- **3.1** සාර්ව ආර්ථික සංවර්ධනය
- **3.2** කෘෂිකර්ම, වාරිමාර්ග , ඉඩම් , පශුසම්පත් හා ධීවර
- **3.3** කර්මාන්ත හා වෙළඳ,විදුලි බල හා බලශක්ති
- **3.4** මහාමාර්ග, වරාය , ගුවන් හා ප්‍රවාහන
- **3.5** නාගරික සංවර්ධන, නිවාස,ජල හා පරිසර
- **3.6** සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික
- **3.7** අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරු තාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ
- **3.8** ප්‍රාදේශීය සංවර්ධනහා සමාජ ආරක්ෂණ
- **3.9** රාජ්‍ය කළමනාකරණය හා පාලන
- **3.10** විමධ්‍යගත අයවැය

**4.** සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය

**5.** මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය

**6.** මූල්‍ය කාර්ය සාධනය

## 01. දැක්ම, මෙහෙවර හා ප්‍රධාන කාර්යයන්

### දැක්ම

දැයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශනය හා පහසුකම් සපයන්නා වීම

### මෙහෙවර

ඉහල මට්ටමේ ක්‍රමසම්පාදන වෘත්තිකත්වයක් පවත්වා ගැනීම හා ක්‍රමසම්පාදන නිපුණතා යාවත්කාලීනව අන්තර්ජාතික මට්ටමට ගෙනඒම හරහා සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා වඩාත් සැලසුම් සහගත ප්‍රවේශයක් අනුගමනය කිරීම තුලින් රටේ සීමිත සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම

### ප්‍රධාන කාර්යයන්

**(i)** ජාතික හා ආංශික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහාය වීම.

**(ii)** මධ්‍ය කාලීන අයවැය රාමුව සකස් කිරීම:රාජ්‍ය ආයෝජන වැඩසටහන.

**(iii)** ව්‍යාපෘති ඇගයීම.

**(iv)** අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සැපයීම.

**(v)** ආංශික ප්‍රවිශය ගොඩනැංවීම සඳහා මුලිකත්වය ගැනීම: ව්‍යාපෘතිපෙළගැස්ම.

**(vi)** සැලසුම් මාර්ගෝපදේශ සැකසීම.

**(vii)** උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සැපසීම.

**(viii)** විමධ්‍යගත මූලධන අයවැය පාර්ශවකරුවන්ගේ දූත මෙහෙයන් කළමණාකරණය කිරීම.

**(ix)** විශේෂ පැවරුම්

**(x)** කාර්යමණ්ඩල ධාරිතා සංවර්ධන

**(xi)** පොදු පරිපාලනය

## 02. දෙපාර්තමේන්තුවේ ඒකක හා අංශ

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලිම පිණිස දෙපාර්තමේන්තුව අංශ 08 කට වෙන් කර ඇත. එම අංශ 08 තවදුරටත් ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රය තුළ විවිධ අංශ නියෝජනය වන පරිදි උප අංශ 26 කට වෙන් කර ඇත.එක් එක් අංශ ඒවා නියෝජනය කරන ක්ෂේත්‍රයට අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුමගින් සිදු කරනු ලබන ඒ ඒ අංශයේ ප්‍රතිපත්ති සැලසුම් නිර්මාණය හා අදාළ අනෙකුත් සංවර්ධන කටයුතු සියල්ල කෙරෙහි වගකීම දරණු ලබයි.

<u>දෙපාර්තමේන්තුවේ අංශ</u>

- සාර්ව ආර්ථික සංවර්ධනය
- කෘෂිකර්ම, වාරිමාර්ග , ඉඩම් , පශුසම්පත් හා ධීවර
- කර්මාන්ත හා වෙළඳ,විදුලි බල හා බලශක්ති
- මහාමාර්ග, වරාය , ගුවන් හා ප්‍රවාහන
- නාගරික සංවර්ධන, නිවාස, ජල හා පරිසර
- සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික
- අධ්‍යාපන උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන , තොරතුරුතාක්ෂණ , විද්‍යා හා තාක්ෂණ
- ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ
- රාජ්‍ය කළමනාකරණය හා පාලන
- විමධ්‍යගත අයවැය

මීට අමතරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් පවත්වාගෙන යාම සඳහා පහත අංශ 3 ද ඇත.

1. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය
2. පරිපාලන අංශය
3. මූල්‍ය අංශය

## 03. ආංශිකකාර්යසාධනය

### 3.1සාර්ව ආර්ථික සංවර්ධනය

<u>සාර්ව ආර්ථික අංශයේ ප්‍රගතිය</u>

ශ්‍රී ලංකාව මැදි ආදායම් රටක් වන අතර එහි ඒක පුද්ගල ආදායම එක්සත් ජනපද ඩොලර් 3,835ක් වේ. 2017 වර්ෂයේ මුල් මාස නවය තුළ ආර්ථික වර්ධන වේගයේ සමානා 3.7ක ප්‍රතිශතයක් පෙන්නුම් කළ අතර එය 3.8, 4.0 හා 3.3ක් ලෙස ප්‍රථම, දෙවන හා තෙවන කාර්තු වල පිළිවෙලින් පෙන්නුම් කළේය. මෙම මන්දගාමී ආර්ථික වර්ධන වේගය ඇති වීමට හේතු වූයේ ගෙවී ගිය මාස 24 ඇති වූ දැඩි නියං තත්ත්වය හා අධික වර්ෂාපතනය විය. වසර 63කට පසු 2017 දී රාජ්‍ය ආදායම හා වියදම අනුව ශ්‍රී ලංකාවේ අයවැය හි මූලික ශේෂය රුපියල් බිලියන 21.9ක අතිරික්තයක් වාර්තාවිය. 2017 වසරේ නොවැම්බර් අවසානය වන විට ගෙවුම් ශේෂය එක්සත් ජනපද ඩොලර් බිලියන 2.0ක අතිරික්තයක් වාර්තා විය. දළ නිල සංචිත 2016 වසර අවසානයේ තිබූ එක්සත් ජනපද ඩොලර් බිලියන 6.0 සිට 2017 වසරේ නොවැම්බර් අවසානය වන විට එක්සත් ජනපද ඩොලර් බිලියන 7.3 දක්වා වර්ධනය විය. ඒ අනුව වෙළඳ ශේෂය 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා එක්සත් ජනපද ඩොලර් -8,590.6ක් විය. තව ද, අපනයනය, 2017 නොවැම්බර් මාසය වන විට නොකඩවා පස්වන මාසය ලෙස ඉලක්කම් දෙකක අගයක පවත්වා ගැනීමට හැකිවිය. මේ අතරතුර ශ්‍රී ලංකාව මානව සංවර්ධනය අතින් කැපී පෙනෙන දියුණුවක් ඇති කළේය. විවිධ විෂමතා පැවතිය ද ජාතික දරිද්‍රතාව 2012/2013 හි තිබූ 6.7 ප්‍රතිශතයේ සිට 2015/16 වන විට 4.1ක ප්‍රතිශතයක් දක්වා අඩු විය. අංශ වශයෙන් සැසඳීමේ දී අනිත් අංශ දෙකට සාපේක්ෂව වතු අංශ වැඩිම අගයක් (8.8 ප්‍රතිශතයක්) පෙන්නුම් කළේය. දිස්ත්‍රික්ක අතර සැලකීමේ දී කිලිනොච්චි දිස්ත්‍රික්කය වැඩිම අගයක් (18.22 ප්‍රතිශතයක්) ද අවම අගය කොළඹ දිස්ත්‍රික්කය (0.9 ප්‍රතිශතයක්) ලෙස පෙන්නුම් කළේය.

සාර්ව ආර්ථික අංශයේ ප්‍රගතිය

- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ අඩංගු රාජ්‍ය ආයෝජන වැඩසටහන පරිච්ඡේදය සකස් කරන ලදි.
- සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ වාර්තා පිළියෙළ කරන ලදි.
- 2017 වසරේදී ඇති වූ ගංවතුර හා නායයෑම් වලින් දැඩි ලෙස හානියට පත් වූදිස්ත්‍රික්ක 14ක ඇති වූ ආපදා තත්ත්වයන් අවම කර ගැනීමට හා එම ප්‍රදේශ නැවත ගොඩනැගීම සඳහා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ආංශික වශයෙන් කරුණු රැස් කර ගනිමින් ආපදා අවදානම් අඩු කිරීම සඳහා වූ සැලැස්මක් පිළියෙළ කරන ලදි.
- කළුතර,රත්නපුර,ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක වල ඉහළ දරිද්‍රතාවයකින් යුත්2017 මැයි මස ගංවතුර හා නායයෑම්වලින් දැඩි ලෙස හානියට පත් සිංහරාජ වනාන්තරය අවට පිහිටි මැතිවරණ බල ප්‍රදේශ හතක් සංවර්ධනය සඳහාසිංහරාජ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන සකස් කිරීම සඳහා මූලික කටයුතු කිරීම.ඒ අතර අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ක නිලධාරීන් දැනුවත් කිරීමේ රැස්වීම්, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දී ම පවත්වන ලදිග

### 3.2 කෘෂිකර්ම, වාරිමාර්ග,ඉඩම්, පශුසම්පත් හා ධීවර අංශ

<u>කෘෂිකාර්මික අංශය</u>

කෘෂිකර්මය තවදුරටත් ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳුනාරටිය ලෙස ක්‍රියා කරනු ඇත 1990 දී සියයට 26 ක්වූ දළ දේශිය නිෂ්පාදිතයට දායකත්වය ,2016 වන විටදි සියයට 7.1 දක්වා අඩුවී ඇත. සාම්ප්‍රදායික

කෘෂිකර්මාන්තය කේන්ද්‍රකරගත් ආර්ථිකයෙන් බැහැරව සේවා අංශය ප්‍රමුක කොට ගත් ආර්ථික රටාවකට නැඹුරු වීම හරහා ක්ෂේත්‍රයේ සැළකිය යුතු ව්‍යුහාත්මක වෙනසක් පෙන්නුම් කල ද තවමත් ග්‍රාමීය වැවිලි අංශ වල ජනගහනයෙන් බහුතරයක් ( සියයට 70 ක් පමණ ) කෘෂිකර්මාන්තයේ යෙදී සිටි ශ්‍රම බලකාය සියයට 28.1 කට පමණ මෙම ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා සලසා දේ. -කෘෂි-පාදක කර්මාන්ත හා සේවා සඳහා අමු ද්‍රව්‍ය සපයමින් හා ආර්ථිකයේ අනෙකුත් ක්ෂේත්‍රය සමඟ තිරස් හා සිරස් ලෙස ඒකාබද්ධව ආර්ථික වර්ධනය වේගවත් කිරිමට කෘෂිකර්මය දායක වී ඇත.

**බෝග කෘෂිකර්මය**

බෝග කෘෂිකර්මය වී, එළවළු, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, පළතුරු හා කුළු බඩු, විසිතුරු මල් හා පැල ඇතුලත් අපනයන කෘෂි බෝගවලින් සමන්විත වේ. වී නිෂ්පාදනය බෝග කෘෂිකර්මයෙහි ප්‍රමුඛතම ආර්ථික ක්‍රියාකාරකම වන අතර මිලියනයකට අධික ගොවීන් ප්‍රමාණයක් ඍජු හා වක්‍ර ලෙස වී නිෂ්පාදනයේ නිරත වී සිටී. 2017 වසරේ දී බෝග කෘෂිකර්ම සංවර්ධනය සඳහා රු. බිලියන 14 ක පමණ මුදලක් ප්‍රාග්ධන ආයෝජන ලෙස වෙන් කරන ඇත.

**විශේෂ වැඩසටහන්**

* කැළණිය විශ්ව විද්‍යාලය සමඟ සහයෝගිත්වයෙන් වී/ සහල් සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් ( MIS ) සකස් කිරීම.
* සනීපාරක්ෂක/ශාක- සනීපාරක්ෂක (sanitary/ phytosanitary ) සහ වෙළඳාම සඳහා පවතින තාක්ෂණික බාධක (Technical barriers to trade) අධ්‍යනයක් කිරීම සම්බන්ධව වැඩමුළුවක් සංවිධානය කිරීම.
* දකුණු පළාත් සංවර්ධන වැඩසටහනේ කෘෂිකර්ම පරිච්ඡේදය සකස් කිරීම.
* උපාය මාර්ග, ජාතික දර්ශක, වැඩසටහන්, ඉලක්කගත අරමුණු වලට ලඟා වීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හඳුනා ගනිමින් දෙවන තිරසාර සංවර්ධන අරමුණට ( කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂතතාව ලඟාකර ගැනීම,වැඩි දියුණු කර පෝෂණය, තිරසාර කෘෂිකර්මය) අදාළ ව වාර්තාවක් කිරීම.
* කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව මඟින් සංවිධානය කරන ලද කෘෂිකර්මය ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති විශ්ලේෂණ කමිටු රුස්වීම් වලට සහභාගී වීම.
* 2017 මැයි මාසයේ පැවති ගංවතුර තත්වය සම්බන්ධයෙන් සකස් කරන ලද පශ්චාත් ආපදා ප්‍රතිසාධනය හා ප්‍රතිසංස්කරණ සැලැස්ම පිළිබඳ වාර්තාවේ කෘෂිකර්මය පරිච්ඡේදය සකස් කිරීම.
* සිංහරාජ ප්‍රදේශය සංවර්ධනය සඳහා සකස් කරන ලද විශේෂ ඒකාබද්ද ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ කෘෂිකර්ම පරිච්ඡේදය සකස් කිරීම.
  * "කෘෂිකර්ම අංශය නවීකරණ" ව්‍යාපෘතියෙහි ප්‍රගති සමාලෝචන රුස්වීම් වලට සහභාගී වීම.
  * කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ආයතන සහභාගී කරගනිමින් "කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක" සම්බන්ධව වැඩමුළුවක් සංවිධානය කිරීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් අවසන් කරන ලද ක්‍රියාකාරකම්**

- ව්‍යාපෘති යෝජනා 39 ක් ඇගයීමට ලක්කර නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- කෘෂිකාර්මික අමාත්‍යාංශය සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 05ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.

## වැවිලි ක්ෂේත්‍රය

වැවිලි අංශය ප්‍රධානවශයෙන් තේ, රබර් සහ පොල් යන බෝග වලින් සමන්විත වන අතර දළ දේශීය නිෂ්පාදිතයට එහි දායකත්වය 2% කි. ආසන්න වශයෙන්, සමස්ත අපනයන ආදායමෙන් 26% ක් වැවිලි අංශයෙන් ජනනය වන අතර එය ඩොලර් බිලියන 2.95ක් (2017) පමණ වේ. තේ අපනයනය 2017 දී ඩොලර් මිලියන 1,535 ක් වන අතර එය 2016 ට වඩා 26% ක් වැඩි වේ. නමුත් 2017 දී අපනයන ප්‍රමාණය (කි. ග්‍රෑ. මිලියන 288.98) 2016 ට වඩා වැඩි නොවේ. එය කි. ග්‍රෑ. මිලියන 288.77 ක් විය. තේ අපනයනයේ විවිධාංගීකරණය මෙම වැඩි වූ අපනයන ආදායම සඳහා ප්‍රධාන හේතුවක් විය හැකිය. වැවිලි භෝග ප්‍රධාන වශයෙන් හෙක්ටයාර් මිලියන 0.9 ක් වගා කරයි. කටු පොල්, සීනි හා කජු යන බෝග ද ආනයන ආදේශන ලෙස දළ ජාතික නිෂ්පාදනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දේ. ජනගහනයෙන් 5% ක් පමණ (ආසන්න වශයෙන් මිලියන 1 ක්) පමණ වැවිලි ප්‍රදේශවල ජීවත්වන අතර, සෘජු හෝ වක්‍රව මිලියන 1.5 කට අධික ජනගහනයක් සඳහා රැකියා සපයයි. රටේ නිෂ්පාදනය අඩු වීම නිසා කර්මාන්තයේ අවශතා සපුරාලීම සඳහා අමුද්‍රව්‍ය සහ විකල්ප නිෂ්පාදන ආනයනය කරන ලදි. වතු බෝගවල නිෂ්පාදනය හා ඵලදායිතාවයට,ගංවතුර, නියඟය හා නායයෑම් වැනි අහිතකර දේශගුණික තත්ත්වයන් ප්‍රධානවම බලපාන ලදි.
වැවිලි ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා කුඩා පරිමාණ වැවිලිකරුවන් සැලකිය යුතු දායකත්වයක් සපයනු ලබන අතර එය මුළු නිෂ්පාදනයෙන් 70% කි. වැවිලි ප්‍රජාව තුළ සමාජ ආර්ථික පහසුකම් නොමැතිකම නිසා ශ්‍රම
බලකාය හා ඔවුන්ගේ ඵලදායීතාවය පහත වැටී ඇත. එබැවින් යහපත් ජීවන තත්ත්වයක් සැපයීම සඳහා ඉන්දියානු රජයේ ආධාර යටතේ නිවාස 2500 ක් ඉදිකිරීම ක්‍රියාත්මක වන අතර වතු ප්‍රජාව සඳහා තවත් නිවාස 10,000 ක් ඉදිකිරීමට තීරණය කර තිබේ.

**විශේෂ වැඩසටහන්**

- රාජ්‍ය ආයෝජන වැඩසටහන (2017-2020) සඳහා වැවිලි අංශය පිළිබඳ වාර්තාවක් සකස් කිරීම.
- දැක්ම 2025 හි වැවිලි පරිච්ඡේදය සඳහා අදහස් දැක්වීම
- පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා ගංවතුර සම්බන්ධ දත්ත රැස් කර වැවිලි අංශෙයේ පරිච්ඡේදයේ සකස්කරන ලදි.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වැවිලි අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති යෝජනා 20 ඇගයීමට ලක්කර අදාල නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- වැවිලි ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 13ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- STARR ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම්, ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සහ අධීක්ෂණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම.

<u>වාරිමාර්ග හා ඉඩම්</u>

2017 වර්ෂයේ වාරිමාර්ග අංශය සඳහා රජයේ සමස්ත වියදම රු. බිලියන 60.19ක් වූ අතර එම මුදලින් රු. බිලියන 53.21ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැය කරන ලදි. ජල සම්පත් සංවර්ධනය යටතේ දැනටමත් ආරම්භ කොටඇතිමහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය,මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය,උමාඔය ජල හැරවුම් ව්‍යාපෘතිය,

දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය,වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය වැනි මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අතරම වාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති රැසක් මගින් කෘෂිකාර්මික හා වෙනත් අවශ්‍යතාවයන් සඳහා ජලය සැපයීම සඳහා ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත. 2017 දී ඉඩම් අංශයෙහි සමස්ත වියදම රු. මිලියන 9,479 ක් වන අතර එයින් රු. මිලියන 3580 ක් ප්‍රාග්ධන වියදම් වේ. 2017 දී ඉඩම් හිමිකම් වැඩ සටහන (බිම්සවිය) සඳහා සැලකිය යුතු මුදලක් වැය කර ඇත. 2017 දී රාජ්‍ය සංවර්ධන වැඩසටහන් සඳහා ඉඩම් හඳුනාගෙන අත්පත් කිරීම සිදු කර ඇත.

**විශේෂ වැඩසටහන**

* 2018 -2020 කාල පරිච්ඡෙදය තුලදී ක්‍රියාත්මක කිරිමට නියමිත සුළු වාරි ව්‍යාපෘති ප්‍රතිසංස්කරණ සැලැස්ම සකස් කිරීම.
* 2017 මැයි මාසයේ පැවති ගංවතුර තත්වය සම්බන්ධයෙන් සකස් කරන ලද පශ්චාත් ආපදා ප්‍රතිසාධන හා ප්‍රතිසංස්කරණ සැලැස්ම පිළිබඳ වාර්තාවේ වාරි අංශයේ පරිච්ඡේදය සකස් කිරීම.
* දකුණු පළාත් සංවර්ධන වැඩසටහනේ වාරි අංශයේ පරිච්ඡේදය සකස් කිරීම.
* මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය මගින් සකස් කරමින් පවතින උතුරු පළාතේ ජල සම්පත් සංවර්ධන සැලැස්ම සඳහා අවශ්‍ය සහය සහ මඟපෙන්වීම ලබා දීම.
* සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා කල්පිටිය ප්‍රදේශයේ ඉඩම් කොටස් 5 ක් ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පැවරීමට අදාලව කැබිනට් පත්‍රිකාවක් පිළියෙල කර ඉදිරිපත් කරන ලදී.

* කඩිනම් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සහ ජාතික ප්‍රමුඛතා ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින් කඩිනම් නැවත පදිංචි කිරීම් පිළිබඳව ආර්ථික කළමනාකරණය සඳහා වන නිළධාරී කමිටුව (OCEM) වෙත වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලදී.

.

* හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රාජ්‍ය ඉඩම් පිළිබඳ දත්ත රැස්කිරීම සහ ගූගල් සිතියමේ ඉඩම් පරීක්ෂා කිරීම සඳහා ස්ථාන සිතියම්ගත කිරීමට අදාලව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට සහයෝගය දීම.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් අවසන් කරන ලද වාරි හා ඉඩම් අංශයන්ට අයත් කාර්යයන්**

1. වාරි අංශයේ ව්‍යාපෘති වාර්තා 13 හා ඉඩම් අංශයේ ව්‍යාපෘති වාර්තා 03ක් ඇගයීමට ලක් කොට, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ විදේශ සම්පත් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවලට ඉදිරි කටයුතු සඳහා යොමු කිරීම.
2. වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 12කට අදාළ නිරීක්ෂණ සකස් කිරීම.
3. මොරගහකන්ද සහ කළුගඟ ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය, වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් කරන ව්‍යාපෘතිය,යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය, දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියසහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සක්‍රියව දායකවීම.
4. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සහ ප්‍රතිපත්ති සමාලොචන රැස්වීම්වලට සක්‍රියව දායකවීම.

5. ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ ලෝක බැංකුව එක්ව සංවිධානය කළ ශ්‍රී ලංකාවේ ඉඩම් පරිපාලනයෙහි ගුණාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම වැඩමුළුව සඳහා සහභාගී වීම .

__පශු සම්පත් අංශය__

ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා විවිධ අංශ හරහා දායකත්වයක් ලබා දෙනු ලබන පශු සම්පත් අංශය ප්‍රධාන වශයෙන් කිරිගව, කුකුළු, සූකර සහ එළුවන් යන උප අංශ වලින් සමන්විත වේ.

මෙම අංශය වර්තමානයේ සමස්ථ දළ දේශීය නිශ්පාදිතය සඳහා 0.8% දායකත්වයක් ලබා දෙමින් මෙරට තුළ ආහාර සුරක්ෂිතතාව පවත්වා ගැනීමටත්, රැකියා උත්පාදනයටත්, ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමටත් හේතු වී ඇත.ගෘහ ඒකක 60,000ක් සෘජුවම මෙම ක්ෂේත්‍රයේ නිරතව සිටින අතර ග්‍රාමීය පවුල් වලින් අසන්න වශයෙන් සියයට 20ක් පමණ සත්ව පාලනය ප්‍රධාන ජීවනෝපාය ලෙස යොදාගනී.

පශු සම්පත් ක්ෂේත්‍රය ප්‍රධාන වශයෙන් 2020 වන විට කිරි වලින් ස්වයංපෝෂිත වීම හා පශු නිෂ්පාදන ආශ්‍රිත රැකියා සහ ආදායම් ඉහල නැංවීම සිදු කරන අතරතුර දැරිය හැකි මිලකට පශු නිෂ්පාදන වල මිල පවත්වා ගෙන යාමත්, රැකියා උත්පාදනය සහ පශු සම්පත් ව්‍යායපාරය ශක්තිමත් කිරීමත් අරමුණු කෙරේ. 2017 වර්ෂයේ පශු සම්පත් අංශය සඳහා රාජ්‍ය ආයෝජනය ප්‍රධාන වශයෙන් කිරිගවයන් ආනයනය, මිල්කෝ සමාගම සතු කර්මාන්තශාලා නවීකරණය, සත්ව රෝග නිවාරණය, පශු සම්පත් ආශ්‍රිත පර්යේෂණ හා නිපුණතා සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කර ඇත.

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ පශු සම්පත් අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 09 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 04ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම
    - . "කිරි ගවයන් 20,000 ක් ආනයනය කිරීම" පිළිබඳ ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටු රැස්වීම්වලට සහභාගී වීම
    - කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති (CARP) පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලයේ පශු සම්පත් පිළිබඳ ජාතික කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම
    - "දකුණු කලාපීය සංවර්ධන වැඩසටහන( Southern Region Development Plan)" සඳහා පශු සම්පත් පරිච්ඡේදය සකස් කිරීම.
    - "අගය දාම විශ්ලේෂණය (Value chain Analysis) "පිළිබඳ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමග එක්ව JICA ආයතනයවිසින් සංවිධානය කරන ලද වැඩමුළුවට සහභාගි වීම.
    - "Post Disaster Recovery and Reconstruction Plan" සඳහාපශු සම්පත් අංශය සඳහා ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම
    - පශු සම්පත් ආශ්‍රිත රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් "කෘෂිකාර්මික ක්ෂේත්‍රයට SDG දේශීයකරණය කිරීම" පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.
    - FAO විසින් සංවිධානය කරන ලද " Gender in Livestock" පිළිබඳ වැඩමුළුව සඳහා සහභාගි වීම
    - ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "කිරි නිෂ්පාදන සංවර්ධන සැලැස්ම (Dairy Development Plan)" වැඩමුළුවට සහභාගි වීම සහ යෙදවුම් ලබා දීම.

ධීවරඅංශය

**රටේ ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් ලබා දෙන ප්‍රධාන අංශයක් ලෙස ධීවර අංශය හඳුනාගෙන ඇත. එය මිලියන 2.6 ක පමණ ජනතාවකට ජීවනෝපාය සැපයීම සහ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.**

**වර්තමානයේ වාර්ෂික ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් 53% ක් මත්ස්‍ය හා වාර්ෂික නිෂ්පාදන වලින් පරිපූර්ණ වේ. වර්තමාන වාර්ෂික ඒකපුද්ගලික මත්ස්‍ය පරිභෝජනය කි.ග්‍රෑ .16.9 කි. එය වසරකට කි.ග්‍රෑ 22 ක් දක්වා වැඩි කිරීමට ඉලක්ක කර ඇත. වර්තමානයේ මෙරට වාර්ෂික මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 520,190 ක් වන අතර සමුද්‍රීය මත්ස්‍ය කර්මාන්තය 87% ක් ද ජලජීවී වගාව හා මිරිදිය ධීවර කර්මාන්තය 11% සහ 2% පිළිවෙලින් වන පරිදි ඒ සඳහා දායකතවයක් ලබා දේ.**

**2017** දී මෙම අංශයේ මුළු රාජ්‍ය ආයෝජනය රුපියල් මිලියන **7,976.6** ක් විය.එයින් ප්‍රාග්ධන ආයෝජන ලෙස රුපියල් මිලියන **6,163** ක් **ධීවර වරාය සහ නැංගුරම් ස්ථාන ගොඩනැංවීම, නවීන තාක්ෂණය හඳුන්වාදීම, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය, ජලජීවී වගා නිෂ්පාදනය වැඩිදියුණු කිරීම, පර්යේෂණ හා සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ ධීවර ප්‍රජාව බල ගැන්වීම සඳහා වෙන් කරන ලදී.**

**ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ධීවර අංශය මඟින් සම්පූර්ණ කරන ලද කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 14 ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- ධීවර ක්ෂේත්‍රයට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ 09 ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

**විශේෂ වැඩසටහන්**

- **කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති (CARP) පිළිබඳ ශ්‍රී ලංකා කවුන්සිලයේ** ජලජ සම්පත්පිළිබඳ **ජාතික කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම**
- CARP යටතේ ජලජ සම්පත් පිළිබඳ ජාතික කමිටුව විසින් සංවිධානය කරන ලද "Global Aquaculture trends" පිළිබඳ වැඩමුළුවට සහභාගී **වීමසහ** යෙදවුම් සැපයීම
- "දකුණු කලාපීය සංවර්ධන වැඩසටහන( Southern Region Development Plan)" සඳහා ධීවර අංශයේ පරිච්ඡේදය සකස් කිරීම
- **"Post Disaster Recovery and Reconstruction Plan" සඳහාධීවර අංශය සඳහා ප්‍රතිපත්ති සැලසුම් කිරීම.**
- " තිරසාර සංවර්ධන ඉලක්ක -14, (උපාය මාර්ග, ජාතික දර්ශක, වැඩසටහන් සහ මූල්‍ය ප්‍රතිපාදන හඳුනා ගැනීම) තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය සහ තිරසාර ලෙස භාවිතා කිරීම"පිළිබඳ වාර්තාවක් සකස් කිරීම
- ධීවර අංශය **ආශ්‍රිත රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් "කෘෂිකාර්මික ක්ෂේත්‍රයට SDG දේශීයකරණය කිරීම" පිළිබඳ වැඩමුළුවක් සංවිධානය** කිරීම

- ධීවර අංශයේ සංවර්ධනය සඳහා වන කමිටුවේ එක් ප්‍රගති සමාලෝචන රැස්වීමක් සංවිධානය කිරීම
- උතුරු හා නැගෙනහිර පළාත්වල ධීවර කර්මාන්තය සඳහා සංවර්ධන යෝජනාවක් සකස් කිරීම -( ONUR Programme)
- නව ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තියක් සැකසීම සඳහා වූ වැඩමුළු සඳහා සහභාගි වීම
- ධීවර අංශය සඳහා ව්‍යාපාරික යෝජනාවක් සම්පාදනයකිරීම

3.3 කර්මාන්ත, වෙළඳ හා ආයෝජන, සංචාරක සහ විදුලි බල හා බලශක්ති

<u>කර්මාන්ත, වෙළඳ හා ආයෝජන</u>

ආර්ථික සංවර්ධනයේ හා තිරසාරභාවයේ නියමු ක්ෂේත්‍රයක් ලෙසට කර්මාන්ත, වෙළඳ හා ආයෝජන ක්ෂේත්‍ර රජය විසින් හඳුනාගෙන ඇති බැවින් කර්මාන්ත, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ රාජ්‍ය ව්‍යාපාර, ජාත්‍යන්තර වෙළඳාම හා විදේශ සෘජු ආයෝජන ශක්තිමත් කිරීම හරහා රටේ සමස්ත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය මැදිහත් වීම ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු විසින් ලබා දේ.

2017 වසර තුළ ඉටු කරන ලද ක්‍රියාකාරකම්.

1. ව්‍යාපෘති යෝජනා 91 ක් ඇගයීම හා අවශ්‍ය නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත ලබා දෙන ලදී.
2. රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 10ක් සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී.
3. සියළු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන්, ආසියානු සංවර්ධන බැංකුව හා ඒකාබද්ධව, උසස් මට්ටමේ නිළධාරීන් සඳහා වන Economic Corridor Development පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම හා ඒ ආශ්‍රිත අධ්‍යයන කටයුතු සඳහා තාක්ෂණික සහය ලබා දෙන ලදී.
4. SASEC වෙළඳ පහසුකම් සැලසීම හා ප්‍රවාහන කටයුතු පිළිබඳ රැස්වීම් මාලාව සංවිධාන කිරීම.
5. SASEC - Sanitary / Phytosanitary& Technical Barriers to Trade Diagnostic Study සඳහා ජාතික උපදේශාත්මක වැඩමුළුවක් සංවිධානය කිරීම.
6. ජාතික අපනයන ක්‍රමෝපාය සඳහා ප්‍රතිපත්තිමය යෙදවුම් (Policy Input) ලබා දීම.
7. අයවැය යෝජනාවක් අනුව දියත්වූ “Global Marketing Campaign” ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම



8. " 2025 දැක්ම" ප්‍රතිපත්තිමය ලියවිල්ල සැකසීමේ වැඩමුළු මාලාව සඳහා ප්‍රතිපත්තිමය යෙදවුම් ලබා දීම.
9. තිරසාර සංවර්ධන අභිමාර්ථ වැඩසටහන සඳහා ආංශික යෙදවුම් (Sectorial Input) ලබා දීම.

<u>කම්කරු හා විදේශ රැකියා</u>

කම්කරු සහ විදේශ රැකියා ප්‍රතිපත්තිය මඟින් ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධන කිරීමට සහ යහපත් කාර්මික සබඳතාවයන් ඇති කරලීමට අපේක්ෂිතය. ඒ අනුව දැනට පවත්නා නීති රීති බලාත්මක කිරීමටත් ඉදිරියට මතුවිය හැකි තත්ත්වයන් සඳහා අවශ්‍ය වන ප්‍රතිසංස්කරණයන් සිදු කිරීමටත් ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සමගාමී කිරීමත් කළ යුතු වේ. මෙම අවශ්‍යතාවය හඳුනාගෙන 2017 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් මෙම අංශය මගින් සිදුකරන ලදී.

1. රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 14 ක් ඇගයීමට ලක් කරන ලදී.
2. අමාත්‍ය මණ්ඩල සංදේශ 6ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
3. ආසියානු සංවර්ධන බැංකුව මඟින් සිදුකරන Country Diagnostic Study සහ Employment Diagnostic Study යන අධ්‍යයනයන් සඳහා තාක්ෂණික සහය ලබා දීම.
4. ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ තොරතුරු තාක්ෂණය පදනම් වූ සම්බන්ධීකරණ පද්ධතිය ( IT based coordination System) සඳහා පැවති දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දායක වීම.

**<u>සංචාරක</u>**

සංචාරක කර්මාන්තය ආර්ථිකයේ 3 වන විශාලතම විදේශ විනිමය උත්පාදන මාර්ගය වන අතර දළ දේශීය නිෂ්පාදනයට එමගින් ලැබෙන දායකත්වය සියයට 3.5 ක් පමණ වේ. 2017 වසර අවසානයේදී සම්පූර්ණ සංචාරක ආගමනය මිලියන 2.1 ක් පමණ වේ. සංචාරක කර්මාන්තය ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන අතර රජය විසින් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ කාර්යය ඉටුකරමින් සුදුසු වාතාවරණය සකස් කර දෙනු ලබයි.

2017 වසර තුලදී සංචාරක අංශයට සම්බන්ධ පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- සංචාරක ප්‍රවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය විසින් යොමුකරන ලද ව්‍යාපෘති 03ක් ඇගයීමට ලක්කර නිරීක්ෂණ ලබා දෙන ලදී.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 04 කට නිරීක්ෂණ සපයන ලදී.

## <u>විදුලිබල හා බලශක්ති අංශය</u>

විදුලිබල හා බලශක්ති යනු දෛනික ජන ජීවිතයට මෙන්ම කර්මාන්ත අංශය සඳහා අත්‍යාවශ්‍ය සාධකයකි. මෙම අංශයේ දියුණුව උදෙසා විශාල වැඩ කොටසක් රජය මගින් සිදුකරනු ලබන අතර එම අරමුණු ඉටු කරලීම පිණිස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සිය දායකත්වය ලබා දෙන ලදී.
ඒ වෙනුවෙන් 2017 වර්ෂයේදී පහත ක්‍රියාකාරකම් මෙම අංශය මගින් සිදුකරන ලදී.

1. මෙම කාල පරාසය තුල ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති 11ක් අනුමත කරන ලදී.
2. මීට අමතරව පහත සඳහන් කර්තව්‍යයන් සිදු කරන ලදී.

   - අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 04ක් සඳහා නිරීක්ෂණ සැපයීම.




   - බලශක්ති ක්ෂේත්‍රයෙහි ව්‍යාපෘති සඳහා වන විදේශ දූත කටයුතු වලට අදාලව නිරීක්ෂ
   - ශ්‍රී ලංකාව ද්‍රවීකෘත ස්වභාවික වායු / ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු මධ්‍යස්ථානයක්බවට පත්කිරීම යන මැයෙන්වැඩමුළුවක්අදාළ සියළු ආයතන සම්බන්ධ කොට ගෙන පැවැත්වීමහා ඒ සඳහා තාක්ෂණික යෙදවුම් ලබා දීම .
   - ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත යෝජිත මන්නාරම සුලං විදුලිබලාගාර ව්‍යාපෘතියේ විදේශ ණය සාකච්ඡාවන් සඳහා සහභාගිවීම.

## 3.4 මහාමාර්ග, වරාය, ගුවන් හා ප්‍රවාහන

<u>මහා මාර්ග</u>

ආර්ථික කටයුතු වර්ධනය වීමත් සමග ප්‍රවාහනය සහ ඒ සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය අත්‍යාවශ්‍ය කාර්යයක් වෙයි. ඒසඳහා නිසි පරිදි ප්‍රතිචාර දැක්වීම රජයේ ප්‍රමුඛතාවයක් විය යුතුය. මාර්ග සඳහා කරනු ලබන ආයෝජන මගින් අනෙකුත් ප්‍රවාහන මාධ්‍ය වන දුම්රිය , නාවුක සහ ගුවන් හා මාධ්‍ය සමඟ ඒකාබද්ධ කරන ලද මාර්ග ජාලයන් සංවර්ධනය කිරිමේදි අරමුණු කරනු ලබනු ලැබේ. එමෙන්ම සුමට ලෙස සංචලන පහසුකම් සැපයීමද සිදු කෙරේ. එමෙන්ම, මාර්ග අංශයේ ආයෝජන රටෙහි ආර්ථික වර්ධනය සමඟ සෘජුවම සහසම්බන්ධව ඇත. මාර්ග අංශයට ඇති ප්‍රධානම අභියෝග අතර රටෙහි සෑම මංසන්ධියක්ම එකිනෙක යාකිරීම, ආර්ථික වර්ධන මධ්‍යස්ථාන, දියුණු වෙමින් පවතින නගර, දිස්ත්‍රික් සහ පළාත් අගනගරයන් අතර නිසි සචලතාව සැපයීම සහ භාණ්ඩ ප්‍රවාහනයට පහසුකම් සැපයීම ආදිය වේ. එවැනි පුළුල් පරාසයක ඇති අභියෝග සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා ව්‍යාපෘති සංකල්ප වැඩිදියුණු කිරීම, ව්‍යාපෘති හඳුනාගැනීම, ව්‍යාපෘති ඇගයීම ආදී කාර්යයන් රාශියක් මාර්ග අංශය මඟින් ඉටුකරන ලදී.

<u>ප්‍රවාහන</u>

පොදු ප්‍රවාහන සේවාවන් නවීකරණය කිරීම තුළින් එය ප්‍රචලිත කිරීමත්, ග්‍රාමීය නාගරික ප්‍රදේශ අතර සම්බන්ධිකරණය වැඩි දියුණු කිරීමත්, නාගරික රථ වාහන තද බදය අවම කිරීමත්, රථ වාහන අනතුරු අවම කිරීමත් තුළින් ප්‍රවාහන අංශය කාර්ක්ෂම කිරීම මෙම අංශයේ අරමුණ වේ. ඒ අනුව දුම්රිය මාර්ග සංවර්ධනය සංඥා සහ මැදිරි,එන්ජින් වැඩි දියුණු කිරීම, බස්රථ ප්‍රවාහන අංශය සංවර්ධනය පොදු ප්‍රවාහන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ආයෝජන සිදු කර ඇත.

<u>වරාය</u>

වරාය සහ ඒ ආශ්‍රිත ක්‍රියාවන්හි සැලකිය යුතු වෙනසක් සිදු වූ වසරක් ලෙස 2017 වර්ෂය හැඳින්විය හැකිය. කොළඹ වරාය එම වසර තුල බහාළුම් 20 සම ඒකක (TEU) මෙහෙය වීම මිලියන 6 ක ප්‍රමාණයක් දක්වා වර්ධනය කරගැනීමට සමත් විය. එමෙන්ම, හම්බන්තොට වරාය සංවර්ධනය සඳහා චීන රජය සමඟ ගිවිසුමකට එළැඹීමද වැදගත් කාර්යයක් වේ. එම වසර තුල රට තුලට පැමිණි සංචාරකයින්ගෙන් 25,644 ක ප්‍රමාණයක් කොළඹ, ගාල්ල සහ අනෙකුත් වරායන් හරහා රටට පැමිණ ඇත.

<u>ගුවන් සේවා</u>

ගුවන් මගීන් 2016 වසර තුළ මිලියන9.5 ක මගීන් සහ භාණ්ඩ මෙට්‍රක් ටොන් 253,941 ක භාණ්ඩ ප්‍රමාණයක් ආරක්ෂාකාරීව ප්රවාහනය කර ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ ගුවන් මගීන් , ගුවන් භාණ්ඩ හා ගුවන් යානා හැසිරවීම සම්බන්ධයෙන් ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරයි. ලොව පුරා ව්‍යාප්ත වූ ශක්තිමත් ගුවන් ජාලයක් මගින් ශ්‍රී ලංකාව ලෝකයේ වඩාත් ජනප්‍රිය සංචාරක

මධ්‍යස්ථානයක් බවට පත් කිරීමත්, ජාත්‍යාන්තර වෙළඳාම සඳහා ගුවන් සේවා සපයන්නා වීමත් ගුවන් ක්ෂේත්‍රයේ ප්‍රධානතම ඉලක්ක වේ.

**විශේෂිත වූ කාර්යයන්**

- රේඛිය අමාත්‍යාංශය මගින් යොමු කළ ඉහත විෂයන් වලට අදාළ ව්‍යාපෘති යෝජනා සහ වැඩසටහන් 23 ක් ඇගයීම.
- මහාමාර්ග , ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශයන්ට අදාළ ඉදිරි යෝජිත ව්‍යාපෘති ලැයිස්තුව සකස් කිරීම.
- මහාමාර්ග , ප්‍රවාහන, ගුවන් හා වරාය යන අංශ වලට ප්‍රතිපත්ති හා සංවර්ධන උපාය මාර්ග සකස් කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.
- පහත සඳහන් කමිටු වල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කිරීම.
  - ප්‍රවාහන ප්‍රතිපත්ති යටත්කාලීන කිරීමේ කමිටුව, මාර්ග ප්‍රතිපත්තිය සැකසීමේ කමිටුව
  - සැහැල්ලු දුම්රිය (LRT) පද්ධතියේ නඩත්තු සහ මෙහෙයුම් යන්ත්‍රනය සකස් කිරීමේ කමිටුව
  - සැහැල්ලු දුම්රිය පද්ධතිය සහ කොළඹ නාගරික දුම්රිය නවීකරණය කිරීම, ඒකාබද්ධ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන, රුවන්පුර අධිවේගී මාර්ගය, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව යන ව්‍යාපෘති වල ව්‍යාපෘති මෙහෙයුම් කමිටු.
- විදේශ ආධාර සඳහා වන දූත මණ්ඩල සටහන් 9 කට පමණ අදහස් දැක්වීම.
- මහාමාර්ග , ප්‍රවාහන, ගුවන් හා වරාය ක්ෂේත්‍ර වල පවතින කාලීන ගැටළු අධ්‍යනය කිරීම.
- මහාමාර්ග , ප්‍රවාහන, ගුවන් හා වරාය ක්ෂේත්‍ර සඳහා යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 11සඳහා නිරික්ෂණ ලබා දීම.
- ප්‍රගති සමාලෝචන කමිටු,මෙහෙයුම් කමිටු හා විදේශ ණය නියෝජිත ආයතන සමග වන රැස්වීම් ප්‍රතිපත්ති යටත්කාලීන කිරීම සඳහා වන රැස්වීම්55කට පමණ සහභාගී වීම.

## 3.5 නාගරික සංවර්ධන,නිවාස,ජල හා පරිසර

**නාගරික සංවර්ධන**

නාගරික සංවර්ධන අංශය මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා සම්බන්ධව කටයුතු කරමින් රටතුල අක්‍රමවත් ලෙස ඇතිවී පවතින නාගරික යටිතල පහසුකම් විධිමත් ලෙස සකස් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනයටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය දායකත්වය සපයනු ලබයි.රටක ආර්ථිකයට සැලකියයුතු දායකත්වයක් සපයනු ලබන්නේ ආර්ථික විභවතාවයන් ඒකරාශීවී පවතින නාගරික ප්‍රදේශයන්ය. අප රටේ ජනගහනයෙන් සියයට 50ක් පමණ මේ වන විටත් නාගරීකරණයට ලක්ව ඇති නමුත් සැඟවුණ නාගරීකරණය හේතුවෙන් මෙය නිශ්චිතවම ගණනය කරගැනීම අපහසු වී ඇත. නගර තුල පවතින සංවර්ධන විභාවතාවයන් හඳුනාගැනීම අනාගත ආයෝජන විධිමත් ලෙස ස්ථානගත වීම සඳහා අවකාශ සලසනු ලබයි. එබැවින් තිරසාර නාගරීකරණයක් ඇතිකිරීම සඳහාත් ආර්ථික සංවර්ධන ක්‍රියාකාරීත්වය පවත්වාගැනීම සඳහාත් නාගරික ප්‍රදේශ විධිමත්ව හා මනා සම්බන්ධීකරණයකින් යුතුව සංවර්ධනය කිරීමට අවශ්‍ය ව්‍යාපෘතීන් සහ ප්‍රතිපත්ති සැකසීම සඳහා මෙම අංශය දායකත්වය සපයනු ලැබේ.

ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධනය සඳහා බස්නාහිර පළාත වැඩි දායකත්වයක් දක්වනු ලබයි. රටේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 6%ක් වැනි සුළු ප්‍රතිශතයක් අත්කරගත්තද සමස්ත ජනගහනයෙන් 29% කටත් වඩා වැඩි පිරිසක් බස්නාහිර පළාත තුල ජීවත් වේ. රටේ දළ ජාතික නිෂ්පාදිතයෙන් 42% ක් පමණ මෙම කලාපය තුල නිෂ්පාදනය කරන අතර කාර්මික අගය එකතු කිරීම අතින් 73% කටත් වැඩි දායකත්වයක් සපයමින් රටේ ආර්ථිකයට ප්‍රධානතම දායකත්වයක් සපයනු ලබයි. බොහොමයක් විදේශ වෙළඳාම බස්නාහිර පළාත හරහා සිදුවන අතර රටේ සෙසු ප්‍රදේශයන්හි ආර්ථික වර්ධනය සහ රැකියා සඳහා අවශ්‍ය මූලික ප්‍රාග්ධනය,මානව සම්පත්,තාක්ෂණය සහ දියුණු සේවාවන් ජනනය කිරීම බස්නාහිර පළාත තුලින් සිදු වේ. එබැවින් බස්නාහිර කලාපය තුල සංකේන්ද්‍රණය වෙමින් පවතින නාගරික ක්‍රියාවලිය තුල භූමිය විධිමත් ලෙස භාවිතයට ගනිමින් අවකාශීය පරිවර්තනයක් ඇතිකිරීම මගින් "ඉහල ආදායම්ලාභී සංවර්ධිත රටක්" ලෙස ශ්‍රී ලංකාව දියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රමුඛතම ක්‍රමෝපාය ලෙස දැනට ක්‍රියාත්මක කරනු ලබන "බස්නාහිර මහානගර සංකල්පය" සලකනු ලබයි.

**ක්‍රියාකාරකම්**

- මෙම අංශය මගින් 2017 වසර සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 08කටත් , ජාතික ප්‍රතිපත්ති හා අමාත්‍යාංශය සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 03කටත් නිරීක්ෂණ සපයා ඇත.
- නාගරික සංවර්ධනය හා නගර සැලසුම් කිරීම සම්බන්ධ ව්‍යාපෘති යෝජනා 159ක් මෙම කාලය තුල මෙම අංශය වෙත ලැබී තිබූ අතර ඉන් ව්‍යාපෘති යෝජනා 153ක් ඇගයීමට ලක් කර අවශ්‍ය කටයුතු සඳහා යොමුකර ඇත.
- නාගරික සංවර්ධනය සම්බන්ධයෙන් අනාගත සංවර්ධන ක්‍රමෝපායන් සහ වැඩපිළිවෙලවල් ඇතුලත් කරමින් සංකල්ප පත්‍රිකා සකස් කිරීම.
- නාගරික සංවර්ධන අංශය සඳහා ඉදිරි වර්ෂ තුල ක්‍රියාත්මක කිරීමේ අරමුණින් යෝජනාවී ඇති ව්‍යාපෘති සලකා බලා ව්‍යපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- 2018 අයවැය සඳහා නාගරික සංවර්ධන අංශය සඳහා වන ප්‍රමුඛ ව්‍යාපෘති හඳුනාගෙන ඉදිරිපත් කිරීම තුලින් අයවැය සකස් කිරීමට දායකවීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක අංක - 11 යටතේ තිරසාර නගර සහ ප්‍රජාවට අදාළව උපාය මාර්ග, ජාතික දර්ශක, වැඩසටහන්,ඉලක්ක ගත අරමුණු වලට ළඟා වීමට අවශ්‍ය මූලා ප්‍රතිපාදන හඳුනාගනිමින් අදාළව වාර්තාවක් සැකසීම.

- මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරෙන උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය තුල හඳුනාගත් නගර සංවර්ධනය කිරීම සඳහා සහයෝගය දක්වන සංවර්ධන හවුල්කරුවන් සමග සාකච්ඡා පැවැත්වීම සහ එම නගර තුල පවතින සංවර්ධන අවශ්‍යතා නිවැරදිව හඳුනාගැනීමට අවශ්‍ය දායකත්වය ලබාදෙමින් එම කටයුතු ජාතික සංවර්ධන න්‍යායන් සමග අනුගත කිරීම

<u>**නිවාස හා ඉදිකිරීම්**</u>

මෙම අංශය මගින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධ කටයුතු ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබයි. මෙම කාර්යයන් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම්, හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, සහ කඳුකර ගම්මාන, නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය වැනි ආයතන වල සහයෝගය ඇතිව සිදු කරන ලදී.

නිවාස හා ඉදිකිරීම් අංශය සඳහා නියම කර ඇති ඉලක්ක සපුරා ගැනීම සඳහා බහුවිධ කාර්යයන් රජය විසින් ඉටු කරයි.අන්ත අසරණ භාවයට පත්වූවන්ගේ එනම් ග්‍රාමීය දිළිඳු ප්‍රජාව , වැවිලි ප්‍රජාව, නාගරික සහ අර්ධ නාගරික අඩු පහසුකම් ජනාවාසවල වෙසන පදිංචිකරුවන් සහ ගැටුම්වලින් පීඩාවට පත් පුද්ගලයින්ගේ නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා මූල්‍ය ප්‍රදාන සහ ආධාර , ද්‍රව්‍යමය ප්‍රදාන හා ආධාර , සහනදායි ණය සහ තාක්ෂණික සහාය ලබා දීම සිදු කරන අතර දැරිය හැකි කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් පෞද්ගලික අංශයට නිවාස වෙළඳපොලෙහි ආයෝජනට සුදුසු පරිසරයක් ඇති කිරීම රාජ්‍ය නිවාස ප්‍රතිපත්තිය යටතේ සිදු කරනු ලබයි.

**සම්පූර්ණ කරන ලද අංශයේ විශේෂ ක්‍රියාකාරකම්**

ව්‍යාපෘති යෝජනා 26 ක් ලැබුණු අතර ඉන් 22 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇගයීමට ලක් කරන ලදී. නිරීක්ෂණ අදාල ආයතනයට පිටපතක් සහිතව ජාතික අයවැය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

- නිවාස හා ඉදිකිරීම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු, කර්මාන්ත හා වෙළඳ සහ මහානගර සහ බස්නාහිර සංවර්ධන යන අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 15 ක් සඳහා නිරීක්ෂණ සකස් කිරීම.

- නිවාස ක්ෂේත්‍රයට අදාලව දක්ෂිණ සංවර්ධන වැඩසටහන සඳහා වාර්තාවක් සකස් කිරීම.

- රේඛීය අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2017 වර්ෂයේදී රැස්වීම් පැවැත්වීම.

- ඉදිකිරීම් කර්මාන්තය ආශ්‍රිත පාර්ශවකරුවන් මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා 2017 වර්ෂයේදී රැස්වීම් මාලාවක් පැවැත්වීම.

- සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරි පනත සහ සහාධිපත්‍ය පනත සංශෝධනය කිරීම සඳහා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංහය විසින් සංවිධානය කරන ලද කමිටු රැස්වීම සඳහා සහභාගි වීම.

- නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගි වීම.

- ආංශීය ඉදිරි යොජිත ව්‍යාපෘති ලැයිස්තු ගත කිරීම.

**<u>ජල සම්පාදනය හා සනිපාරක්ෂාව :-</u>**

රටේ ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් පමණක් ලෙස නොව ජල සම්පාදනය හා සනීපාරක්ෂාව , රටක සමාජ ආර්ථික වර්ධනය සඳහාද වැදගත් මූලිකාංගයක් වේ. ප්‍රමාණවත් හා ගුණාත්මක ජල සැපයුමක් මෙන්ම ජනතාවට දැරිය හැකි පිරිවැයකට ලබා ගතහැකි ලෙස රට පුරාම ආරක්ෂිත පානීය ජල ප්‍රවේශයක් ඇති කිරීම අත්‍යාවශ්‍යවේ.එමනිසා, ආංශීය වශයෙන් පවත්නා රජයේ ප්‍රතිපත්තිය වන්නේ 2020 වන විට රටේ සියලුම ජනතාවට අවශ්‍ය ආරක්ෂිත පානීය ජලය ලබා දීමත්, එයින් සියයට 60 කට පමණ පානීය නළ ජලය ලබා දීමත් සහ රටේ නාගරිකව වෙසෙන ජනගහනයෙන් සියයට 7 කට පමණ අපජල පහසුකම් ලබාදීමත්ය.

මෙම අංශයේ උපායමාර්ගික දිශාවන් ප්‍රධාන වශයෙන් හඳුනා ගෙන ඇත්තේ ආංශීය වශයෙන් පවත්නා ගැටළු හා අපහසුතාද, තිරසාර සංවර්ධන අරමුණු 6 යටතේ හඳුනාගෙන ඇති සැමට දැරිය හැකි මුදලකට ආරක්ෂිත පානීය ජල හා සනීපාරක්ෂණ පහසුකම් ඇති සාධාරණ පරිසරයක් 2030 වන විට ගොඩනැගීම යන ඉලක්කයන්ද සලකා බැලීමෙනි.රටේ සියලුම ජනතාවට අවශ්‍ය ආරක්ෂිත පානීය ජල හා සනීපාරක්ෂණ පහසුකම් වෙත සාධාරණ ප්‍රවේශයක් ඇති කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, මෙම පහසුකම්හි ප්‍රාදේශීය වශයෙන් ඇති විෂමතාවයන් අවම කිරීම සඳහා රජය විසින් මධ්‍ය කාලීනව අවධානය යොමු කරනු ලැබේ.

ඒ අනුව,මෙම අංශයේ ආයෝජනයන් මඟින් මෙම වර්ෂයේ දී මෙන්ම මධ්‍යකාලීනව ප්‍රධාන වශයෙන් ප්‍රමුඛතාවයන් ලබාදී ඇත්තේ,ආවරණය කර නොමැති නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල පානීය නළ ජල පහසුකම් ඉහල නැංවීම,ගෘහස්ථ නිවාස සඳහා ආරක්ෂිත හා විශ්වසනීය ජල සැපයුමක් සැපයීම, හඳුනා නොගත් නිදන්ගත වකුගඩු ආශ්‍රිත රෝග පවත්නා ප්‍රදේශ වලට අරක්ෂිත පානීය ජලය ලබා දීම,ඉහල ජල ඝනත්වයක් පවතින, ග්‍රාමීය හා වතු යන ප්‍රදේශ වෙත විශේෂ අවධානයක් යොමු කරමින්, රට තුල සනීපාරක්ෂණ පහසුකම් ඉහල නැංවීමට වේ.

ඒ සමඟම අඩු ජන ඝනත්වයක් සහිත ප්‍රදේශවලට පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා ග්‍රාමීය ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති ධෛර්යමත් කරනු ලැබේ.

**වර්ෂය තුළ සිදු කරන ලද ආංශික කාර්යයන්:**

- නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 07 ක මූලික අධ්‍යයන කටයුතු සිදු කරන ලදී. ඒවා සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාලව සකස් කරන ලද නිර්දේශවර්තා අදාල පරිදි ජාතික අයවැය දෙපාර්තමේන්තුවට හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- අදාළ අමාත්‍යාංශය විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 05 කට අදාල නිරීක්ෂණ ලබා දීම.
- විදේශීය ණය නියෝජිතායතන විසින් ඉදිරිපත් කරන ලද විදේශිය ණය ගිවිසුම් සම්බන්ධයෙන් වන සටහන් 07 කට (Aide Memoires) පමණ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිරීක්ෂණ ලබා දීම.
- ප්‍රගති සමාලෝචන කමිටු, මෙහෙයුම් කමිටු හා විදේශ ණය නියෝජිතායතන සමඟ පවත්වන රැස්වීම් ආදී රැස්වීම් 24 කට පමණ සහභාගී වීම.
- ආංශික සංවර්ධන ව්‍යාපෘතීන්හි පවත්නා ගැටළුකාරී තත්ත්වයන් සාකච්ඡා කිරීමට අවශ්‍ය පරිදි රැස්වීම් සංවිධානය කිරීම හා ඊට අදාළ පසු ක්‍රියාමාර්ග ගැනීම.
- ආංශීය ඉදිරි යෝජිත ව්‍යාපෘති ලැයිස්තු සකස් කිරීම.

<u>**පරිසර කළමනාකරණය**</u>

නියමිත ආයෝජනයන් සිදුකරමින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට පහසුකම් සපයන අතරතුරදී පාරිසරික ගුණාත්මක බව තහවුරු කරමින් තිරසාර සංවර්ධනයක් කෙරෙහි යොමුවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පරිසර කළමනාකරණය තුළින් බලාපොරොත්තුවේ දූෂණයෙන් තොර පරිසරයක් හා වස-විසෙන් තොර ආහාර රටාවක් තහවුරු කිරීම සඳහා පරිසර ප්‍රතිපත්තිය තුළ හරිත සංවර්ධනය යන සංකල්පය වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

දිනෙන් දින වර්ධනය වන ජනගහනයේ ප්‍රතිඵලයක් ලෙස ආහාර, ජලය, බලශක්තිය, ඉඩම්, හා අනෙකුත් ස්වාභාවික සම්පත් සඳහා වන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් හරිත, පිරිසිදු සහ අනුහුරු සංවර්ධනයක් ළඟාකර ගැනීමේ ගෝලීය අපේක්ෂාව බරපතල අභියෝගයකට ලක්ව තිබේ. පරිසර විනාශයේ ප්‍රතිඵලයක් මෙන්ම ඊට හේතුකාරකයක්ද වන දේශගුණික විපර්යාස තවත් විශේෂිත අභියෝග රැසක් මතු කරයි. ශීඝ්‍ර දේශගුණ විපර්යාසයන්ගේ බලපෑම් තිරසාර සංවර්ධනය ළඟා කරගැනීමේ අවස්ථාව දුර්වල කරන අතරම දිළිඳුකම පිටුදැකීම සඳහා ඇති සම්පත් මෙන්ම කාල පරාසයද සීමාකරයි. එබැවින් පිරිසිදු, වඩා කාර්යක්ෂම සහ සාධාරණ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා වූ සුදුසු වැඩපිළිවෙලක අවශ්‍යතාවය මතුව තිබේ. මේ අනුව සංවර්ධන ආර්ථිකයන්හි ඉතා වැදගත් අංශයක් ලෙස පරිසරය සැලකිය හැකි අතර එය නවීන ආර්ථික විද්‍යාවෙහි අළුතින් මතුවී එන අංගයක් වේ.

පරිසර කළමනාකරණයේ විෂය පථයට පරිසර දූෂණය පාලනය කිරීම, කසළ කළමනාකරණය, වනාන්තර සංරක්ෂණය, තිරසාර ඉඩම් කළමනාකරණය, මිනිස් - වනජීවී සහ පැවැත්ම, ජීවී සම්පත් සංරක්ෂණය සහ ආයතනික ප්‍රතිව්‍යුහගත කරණය ආදිය ඇතුලත් වේ.

අවම කාබන් පරිහරණයකින් යුතු පිරිසිදු හරිත පරිසරයක් ළඟා කර ගැනීම, පරිසර දූෂණය අවම කිරීම, ඉහළ ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සේවා, පාරිසරික අවදානම අඩු කිරීම කාර්යක්ෂම සහ තිරසාර සම්පත් පරිභෝජනය තුළින් ජීවන තත්වය උසස් කිරීම, පාරිසරික ගුණාත්මක බව ඉහළ නැංවීම සහ ස්වාභාවික උපද්‍රවයන්ගේ බලපෑම් අවම කිරීම යන කරුණු කෙරෙහි පරිසර කළමනාකරණ අංශයේ අවධානය යොමුවී ඇත. තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මනා පරිසර කළමනාකරණය ඉතාමත් වැදගත් අවශ්‍යතාවයක් වේ. එබැවින් සංවර්ධන සැලසුම්කරණයේදී පාරිසරික සමතුලිත තාවය පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන ජෛව විවිධත්වය සංරක්ෂණය හා පරිසර පද්ධති පිළිබඳ නිසි අවධානය යොමුකිරීම අත්‍යාවශ්‍යවේ.පරිසර කළමනාකරණ අංශය ලඟා කර ගැනීමට අපේක්ෂා කරන ප්‍රධාන ඉලක්ක කිහිපයක් පහත පරිදි වේ.

- 2018 වසර වන විට කසල වලින් තොර, විධිමත් කසල කළමනාකරණයක් සහිත රටක් බිහි කිරීම.
- 2018 වසර වන විට දිවයින වටා පිහිටි සමුදුර දූෂණයෙන් තොර කලාපයක් බවට පත් කිරීම.
- 2018 වසර වන විට වන ගහනය29% සිට 32% දක්වා හෙක්ටයාර 60,000 කින් ඉහළ නැංවීම.
- 2018 වසර වනවිට,වසරකටපාරිසරිකසංචාරකයින්800,000ක්ආකර්ශණයකරගැනීමසහරු. මිලියන2,500කආදායමක්ඉපයීම
- 2025 වසර වන විට අලි-මිනිස් ගැටුම මුලිනුපුටා දැමීම සඳහා ජෛව වැටවල්ද සමඟ කි. මී. 3,050 ක දිගින් යුතු විදුලි වැටවල් ඉදිකිරීම.
- 2020 වසර වන විට,මෙරටට ආනයනය කරනු ලබන විද්‍යුතයෙන් පමණක් ක්‍රියා කරන වාහන ප්‍රමාණයේ ප්‍රතිශතය 25%ක් දක්වා ඉහළ නැංවීම.
- 2020 වසර වන විට ජාතික විදුලි සැපයුම් ජාලයට පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ලබා දෙනු ලබන දායකත්වය 20%ක් දක්වා ඉහළ නැංවීම.
- 2005-2015 ට සාපේක්ෂව 2030 වන විට ආපදා හේතුවෙන් සිදු වන මරණ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස අඩු කිරීම.
- 2018 වසර වන විට කාලගුණ වාර්තාවන්ගේ නිරවද්‍යතාවය 70% සිට 72% දක්වා ඉහළ නැංවීම.
- 2018 වසර වන විට නාය යෑම් හේතුවෙන් සිදු වන ජීවිත හානි වැළැක්වීම.
- 2018 වසර වන විට ගංවතුර තත්ත්වයන්ගේ බලපෑමට ලක්වන ජන සංඛ්‍යාව 50%කින් පහළ දැමීම.

**විශේෂ අවස්ථා**

- පරිසර කළමනාකරණ අංශයට අදාළව රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද ව්‍යාපෘති යෝජනා 19 ක්ඇගයීමට ලක් කිරීම.

- රේඛීය අමාත්‍යාංශ විසින් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ 21 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායයන් සැකසීම සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශ සහ ආයතන වෙත තාක්ෂණික සහයෝගය ලබා දීම

## 3.6 සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා සංස්කෘතික

**සෞඛ්‍ය**

රටකට ඉහළ ආර්ථික වර්ධනයක් සඳහා නිරෝගී ජාතියක් පැවතීම වැදගත් වේ. එහෙයින් ජාතික සෞඛ්‍ය සේවය සඳහා ඉහළ ආයෝජනයක් කිරීම, අවශ්‍ය ආයතනික හා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ කිරීම තුලින් නිරෝගී ජාතියක් ගොඩ නැගීම රජයේ ප්‍රතිපත්තිය වේ. ඒ සඳහා 2017 වසර තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබිණි.

- ව්‍යාපෘති යෝජනා 34ක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ලබා දී ඇති අතර අදාළ නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතන වෙත යොමු කර ඇත.

- තෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (සෞඛ්‍ය අංශය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය )සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සැකසීම සඳහා වැඩමුළුවලට සහභාගී වීම හා අවශ්‍ය නිර්දේශ/යෝජනා ලබා දී තිබේ.

- පශ්චාත් ආපදා ප්‍රතිසාධනය සහ ප්‍රතිසංස්කරණ සැලැස්ම (Post Disaster Recovery and Reconstruction plan) සැකසීම සඳහා සෞඛ්‍ය අංශයට අදාළ වාර්තාවක් සකස් කරන ලදී.

- දකුණු පළාත තුළ සෞඛ්‍ය අංශයේ අවශ්‍යතාවයන් විශ්ලේෂණය කරමින් හඳුනාගත් සංවර්ධන ව්‍යාපෘති ඇතුලත් කර සකස් කරන ලද " දකුණු පළාත් සංවර්ධන වැඩසටහන" (Southern Development Programme) සඳහා සෞඛ්‍ය අංශයට අදාළ වාර්තාවක් සකස් කරන ලදී.

- විදේශ මූල්‍ය පහසුකම් ලබා ගැනිම සඳහා යොමු කර ඇති සෞඛ්‍ය අංශයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිරීක්ෂණ ලබා දී ඇති අතර ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය වැනි සංවර්ධන පාර්ශ්වකරුවන් සමඟ ඒ සම්බන්ධයෙන් රැස්වීම් පවත්වා ඇත.

- සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ ප්‍රතිපත්ති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම.

**ක්‍රීඩා අංශය**

මෙරට සෑම පුරවැසියකුම ක්‍රීඩා හා ශාරීරික ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම හරහා මේ වන විට දැවෙන ප්‍රශ්ණයක් බවට පත්ව ඇති බෝ නොවන රෝග අඩු කිරීම තුළින් සෞඛ්‍යමත් ජාතියක් ගොඩනැගීම රජයේ ඉලක්කය වේ. මෙම සංකල්පය සමාජ ගත කිරීමේ අරමුණින්, 2016 වසරේ සිට රජය විසින් ක්‍රීඩා හා ශාරීරික සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ සතිය යනුවෙන් සතියක්ද නම් කරනු ලැබිණි. ඒ අනුව 2017වසරේ පෙබරවාරි 6 සිට 12 දක්වා ක්‍රීඩා සතිය ලෙස නම් කරනු ලැබිණි. මීට අමතරව සෑම පාසැල් සිසුවකුට ක්‍රීඩාවක යෙදීම අනිවාර්ය කිරීමේ රජයේ අරමුණ ප්‍රකාශයට පත් කළ අතර, පාසැල් ළමුන්ගේ විශේෂ ක්‍රීඩා දක්ෂතා මුල් වයස් කාණ්ඩ වලදී හඳුනාගෙන, ඒවා දියුණු කිරීමේ වැඩසටහන්ද සම්පාදනය කරනු

ලැබිණි. ක්‍රීඩා ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් සැළකිය යුතු ආයෝජනයක් සිදු කරනු ලැබිණි. ක්‍රීඩා අංශය සම්බන්ධයෙන් වසර තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබිණි.

* ව්‍යාපෘති වාර්තා **16**ක් ඇගයීමට භාජනය කර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නිර්දේශ ඉදිරිපත් කිරීම
* ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍යමණ්ඩල සංදේශ 02ක් සඳහා නිරීක්ෂණ ලබාදීම
* 2017 මැයි මාසයේ සිදු වු ගංවතුර හා නායයෑම් සම්බන්ධව සකස් කරන ලද ''පශ්චාත් ආපදා කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ සැලැසුම'' සඳහා ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ව දත්ත සකස් කිරීම හා එම ක්ෂේත්‍රය සම්බන්ධව වාර්තාවක් සකස් කිරීම
* ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා සම්බන්ධයෙන් පැනනැගුනු ගැටළු විසඳීම සඳහා එම අමාත්‍යාංශය හා අදාළ අනෙකුත් ආයතන නියෝජනය කරන නිළධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීම
* ''ක්‍රීඩා හා ශාරීරික සුවතා ප්‍රවර්ධන සතියට'' සමගාමීව ''බෝනොවන රෝග වැලැක්වීම සඳහා ශාරීරික ක්‍රියාකාරකම් වල නිරත වීම වැදගත්කම'' මැයෙන් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය සඳහා 2017 පෙබරවාරි 8 වන දින දේශනයක් සංවිධානය කිරීම.

<u>ආගමික, සංස්කෘතික සහ උරුමයන්, ජාතික සහජීවනය, සංවාද සහ රාජ්‍ය භාෂා අංශය</u>

මෙම අංශය යටතේ බුද්ධ ශාසන අමාත්‍යාංශය, පුනරුත්තාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික සහජීවනය,සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය යන අමාත්‍යාංශ 07 හි සංවර්ධන කටයුතු පිළිබඳ සලකා බලයි. මෙම අමාත්‍යාංශ හත මගින් බුද්ධ ශාසන, හින්දු, ක්‍රිස්තියානි සහ මුස්ලිම් යන ආගම් ද සංස්කෘතිය හා උරුමයන්, ජාතික ලේඛනාරක්ෂාව, ජාතික කෞතුකාගාරය, රාජ්‍ය භාෂා සහ සමාජ ඒකාබද්ධතාවය යන ක්ෂේත්‍රයන් ආවරණය කරනු ලැබේ.

**විශේෂ සිදුවීම්**

- ආමාත්‍ය මණ්ඩල පත්‍රිකා දෙකක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- ඉහත සඳහන් අමාත්‍යාංශ වෙතින් 2017 වර්ෂය සඳහා ලැබුණු ව්‍යාපෘති වාර්තා 18ක් සඳහා ජාතික අයවැය හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබාදීම.

- ජාතික සංහිදියාව, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ පවත්වන ලද උපදේශන කමිටු සඳහා සහභාගී වීම.

## 3.7අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා නිපුණතා සංවර්ධන,තොරතුරු තාක්ෂණ, විද්‍යා හා තාක්ෂණ

### අධ්‍යාපන අංශය

ප්‍රධාන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට අවශ්‍ය අඩිතාලම 2017 වසරේදී සකස් කරන ලදී. මෙම ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය ඇතුළුව පාසැල් පද්ධතියේ සිදු කළ යුතු වන වෙනස් කම් සිදු කිරීම සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ.
තවද, පානීය ජල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, පන්ති කාමර, විද්‍යාගාර සහ විද්‍යාගාර උපකරණ වැනි අවශ්‍ය මූලික පහසුකම් පාසැල්වල ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘති හා වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරිණ.

2017 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

- අධ්‍යාපන අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ පැවති අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉදිරි මඟ සහ යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.
- අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන **(ESDP)**, දැනුම් සමාජයක් සඳහා අධ්‍යාපනය ව්‍යාපෘතිය **(TSEP)** යන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම තවදුරටත් පුළුල් කිරීම සඳහා වන "ජාතික ඉ-ඉගෙනුම් පද්ධතිය ද ඇතුළුව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පරිපූර්ණ තොරතුරු තාක්ෂණ ක්‍රමෝපායක් ස්ථාපනය කිරීම සඳහා පළාත් හා කලාප මට්ටමින් තොරතුරු තාක්ෂණ කේන්ද්‍රස්ථාන ස්ථාපනය කිරීම" ව්‍යාපෘතිය හා සම්බන්ධ වැඩමුළු හා රැස්වීම්වලට සහභාගී වීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.
- අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ **7**ක් සඳහා නිරීක්ෂණ සැපයීම.
- අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් **14** ක් ඇගයීම**.**

### උසස් අධ්‍යාපන

2017 වර්ෂය තුළ, උසස් අධ්‍යාපන අංශය තවදුරටත් වර්ධනය වූ අතර, රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන අතරම, විශේෂයෙන්ම අ.පො.ස (උසස්/පෙළ) තාක්ෂණවේදී විෂය ධාරාව හදාරන ලද සිසුන් සඳහා විශ්වවිද්‍යාල වරම් ලබා දීම සඳහා තාක්ෂණවේද පීඨ ඇතුළු නව අධ්‍යයන පීඨ ආරම්භ කරන ලදී. එමෙන්ම, නව අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීම සහ පවතින අධ්‍යයන පාඨමාලා නවීකරණය කිරීම මඟින් නිසි රැකියා අවස්ථා ලබා ගත හැකි උපාධිධාරීන් බිහිකිරීම පිළිබඳ ප්‍රමුඛ අවධානයක් යොමු කෙරිණ. ඊට අමතරව, කර්මාන්ත අංශය සමඟ සබඳතා ගොඩනගාගැනීම සඳහා

විශ්වවිද්‍යාල රැසක් විසින් පියවර ගන්නා ලද අතර, විශ්වවිද්‍යාල තුළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපනය කරන ලදී.

රටේ ශිෂ්‍ය ප්‍රජාවට පවතින උසස් අධ්‍යාපන අවස්ථා නංවාලීමේ අරමුණින්, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විධිමත් කිරීමට ද, ඒවා තවදුරටත් පුළුල් කිරීමට ද පියවර රැසක් ගන්නා ලදී.

2017 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වන සිසුන් සඳහා රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට ණය පහසුකම් ලබා දීමේ යෝජනා ක්‍රමයපිළිබඳ සාකච්ඡා සඳහා ක්‍රියාකාරීව සහභාගී වීම.

- උසස් අධ්‍යාපන අංශයේ විදේශ ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතිවල මෙහෙයුම් කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම සහ ඒ පිළිබඳව මෙරටට පැමිණෙන නියෝජිත කණ්ඩායම් සඳහා රැස්වීම් සංවිධානය කිරීම හා ඒවාට සහභාගී වීම.

- උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශයෙන් සහ අදාළ ආයතනයන්ගෙන් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තා ඇතුළත් කරමින් ඉදිරි ව්‍යාපෘති පෙළගැස්ම යාවත්කාලීන කිරීම.

- උසස් අධ්‍යාපන අංශයේ නව ව්‍යාපෘති සහ වැඩසටහන් 44ක් ඇගයීම.

<u>නිපුණතා අධ්‍යාපන අංශය</u>

රටෙහි තිරසාර ආර්ථික සංවර්ධනක් සඳහා ඉහළ නිපුණතාවයකින් යුත් ශ්‍රමබලකායක්සිටීම අවශ්‍ය වේ. එබැවින් වසර 2020 වන විට ජාතික වෘත්තීය සුදුසුකම් සහිත 175,000 ක්ද ඇතුළුව වසරකට විවිධ ක්ෂේත්‍රයන්ට අදාල නිපුණතා සහිත තරුණ, තරුණියන් 250,000 ක් බිහිකිරීම අරමුණු කර ඇත. මෙහිදී හැකියාවන්, මෘදු කුසලතාවයන්වැඩිදියුණු කිරීමත් වෘත්තීය පුහුණු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සහ ගුණාත්මක වෘත්තීය පුහුණුවකට ඇති ප්‍රවේශය ශක්තිමත් කිරීමත් තුලින් ගෝලීය ආර්ථිකය තුළ සේවා නියුක්ත විය හැකි ශ්‍රී ලාංකිකයෙකු බිහිකිරීම මූලික ප්‍රතිපත්තිය වේ.

**2017 වර්ෂයේදී ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 8ක් ඇගයීමට ලැබුණු අතර ඒ සියල්ල ඇගයීම් කර අවසන් කර ඇති අතර ඊට අදාල නිරීක්ෂණ එකී ආයතන, විදෙස් සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබේ.මීට අමතරව නිපුණතා අධ්‍යාපන අංශයට සම්බන්ධ විවිධ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධව ඉදිරිපත් වූ කැබිනට් පත්‍රිකා 6ක් සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත.

- ව්‍යාපෘති සැකසීමට අදාල ගැටළු හා ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන විට අන්තර් ගත කල යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ යටතේ ඇති විවිධ නිපුණතා සංවර්ධන ආයතන සමඟ හා සංවර්ධන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා දැනුවත් කිරීම.

- තවද, වෘත්තීය පුහුණුව සඳහා ඇතුලත් වන සංඛ්‍යාව ඉහළ නැංවීම සම්බන්ධවත් එහිදී පාසැල් හැරයන්නන් වෘත්තීය පුහුණු අංශය කරා යොමු කරවා ගැනීම සම්බන්ධවත් වැඩි පුමුඛතාවයක් ලබා දෙන ලද අතර වෘත්තීය පුහුණ අධ්‍යාපනයේ ගුණත්වය හා අදාලත්වය ඉහළ නැංවීම පිළිබඳ සාකච්ඡා පැවැත්වීම.

- රාජ්‍ය ආයෝජන සැලැස්ම යටතේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශයේ ඉදිරි සැලසුම් හා ආයෝජන ව්‍යාපෘති ප්‍රමුඛතා ගත කිරීම හා ලැයිස්තුගත කිරීම.

- නිපුණතා ආංශීය සංවර්ධන වැඩසටහනට අදාලව අන්තර් අමාත්‍යාංශ කමිටු රැස්වීම පැවැත්වීම හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අදාල නිලධාරින් සමඟ සාකච්ඡා පවත්වා ගැටළු විසදීම.

**<u>තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන</u>**

තොරතුරු තාක්ෂණය, මාධ්‍ය, තැපැල් හා විදුලි සංදේශ යන අංශවලින් තොරතුරු හා සන්නිවේදන අංශය සමන්විත වේ. තොරතුරු තාක්ෂණ සම්බන්ධ සේවා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර බාහිරකරණ (ICT/BPO) සහ දැනුම් බාහිරකරණ (ICT/KPO) යන ආදායම් උපයන කර්මාන්ත තොරතුරු තාක්ෂණ අංශයට ඇතුළත්ය.

ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය දැනුම පාදක කරගත් සේවා අංශයක් ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිය. මෙම අංශය තුළ තොරතුරු හා සන්නිවේදන පහසුකම් ඉහළ නැංවීම, තොරතුරු හා සන්නිවේදන මාධ්‍ය වෙත ළඟාවීම පහසු කිරීම, ඉ-රාජ්‍ය සේවා ප්‍රවර්ධනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට වැදගත්වන නීතිමය පසුබිම සැකසීම යන කරුණු කෙරෙහි රජය මූලික අවධානය යොමු කරන අතර පද්ධති වැඩිදියුණු කිරීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගත් සේවා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම තුළ පෞද්ගලික අංශය අතිශය වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

**විශේෂ ක්‍රියාකාරකම්**

- අදාළ අමාත්‍යාංශ මගින් යොමු කරන ලද නව ව්‍යාපෘති යෝජනා 50 ක් ඇගයීමට ලක්කර ඇත.
- තොරතුරු තාක්ෂණ අංශය සඳහා ව්‍යාපෘති ප්‍රමුඛතා ලේඛනය (Project Pipeline) සකස් කිරීම.
- විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ, තැපැල් හා ජනමාධ්‍ය අංශවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 03කට නිරීක්ෂණ සපයා ඇත.
- රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා ක්ෂේත්‍ර සටහන් සැකසීම
- තොරතුරු තාක්ෂණහා සන්නිවේදන අංශයට අදාල රැස්වීම් සඳහා සහභාගි වීම.

**<u>විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ</u>**

ලෝකයේ ප්‍රමිතිවලට අනුකූලව මෙරට පර්යේෂණ හා තාක්ෂණ අංශය සංවර්ධනය කිරීම රජයේ ප්‍රධාන ඉලක්කයකි. අධිතාක්ෂණික කර්මාන්තකරණය රටක ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් කරා යොමු කරයි. දේශීය සමාගම් වල ගුණාත්මකභාවය, ඵලදායීතාවය සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා රජය ඉහළ තාක්ෂණික කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන තිබේ. නැනෝ තාක්ෂණය සහ ජෛව තාක්ෂණය ඇතුළු උසස් තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය ආහාර සැකසීම, පටක රෝපණය සහ පොහොර වැනි කර්මාන්ත සඳහා අගයක් එකතු කර ඇත.

**නිමකළ කාර්යයන්**

- ව්‍යාපෘති වාර්තා 10ක් විශ්ලේෂණය කර අදාල නිරීක්ෂණ ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ 10ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරිම
- විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ව්‍යාපෘති යෝජනා ඇගයීම පිළිබඳ සාකච්ඡා කීපයකට සහභාගී විම.

## 3.8 ප්‍රාදේශීය සංවර්ධන හා සමාජ ආරක්ෂණ අංශය

<u>**සමාජ ආරක්ෂණ අංශය**</u>

**සමාජ ආරක්ෂණ අංශයට අදාල ප්‍රගතිය**

සමාජ ආරක්ෂණ අංශය;සමාජ සවිබල ගැන්වීමේ, සුභ සාධන සහ කන්ද උඩරට උරුමය අමාත්‍යාංශය, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්තාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යන රේඛීය අමාත්‍යාංශ සමඟ සහයෝගීතාවයෙන් වැඩකටයුතු කරනු ලබයි. අවදානමට ලක්වූ ජන කොටස්, එනම්; ළමුන් , වරප්‍රසාද නොලත් කාන්තාවන් , වැඩිහිටියන් හා ආබාධිත පුද්ගලයන් සඳහා ඉලක්ක ගත වූ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම මඟින් ඔවුන්ගේ සුභසාධනය ඇති කිරීම කෙරෙහි රජයේ විශේෂ අවධානය යොමු වී ඇත. ඒ අනුව , අවධානමට ලක්වූ ජනගහනය ඉලක්ක කර ගනිමින් ප්‍රධාන සුභසාධන හා ජීවන තත්ත්වය ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, එමඟින් ආර්ථික හා සමාජයීය සංවර්ධනයේ ප්‍රතිලාභ රටේ සෑම පුරවැසියෙකුටම භුක්ති විඳීමට හැකිවනු ඇත. ඒ අනුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව රේඛීය අමාත්‍යාංශ හා එක්ව මෙම ජන කොටස්වල ජීවන තත්ත්වය නඟා සිටුවමින් ඔවුන්ව රටේ සංවර්ධන ප්‍රවේශයට අනුගත කිරීම සඳහා අවශ්‍ය මැදිහත් වීම් සිදුකරනු ලබයි.

**ඉටුකරන ලද කාර්යයන්**

- **ව්‍යාපෘති වාර්තා සඳහා ඇගයීම් වාර්තා සහ කැබිනට් පත්‍රිකා සඳහා නිරීක්ෂණ සකස් කිරීම**

  ව්‍යාපෘති වාර්තා 27 ක් සඳහා ඇගයීම් වාර්තා සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට සහ අදාල අමාත්‍යාංශවලට යොමු කිරීම. අදාල අමාත්‍යාංශවලින් යොමුකරන ලද කැබිනට් පත්‍රිකා 20 ක් සඳහා නිරීක්ෂණ සැපයීම.

- **තිරසාර ලෙස ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීම – ග්‍රාමීය ප්‍රජාව ශක්තිමත් කිරීම සඳහා වැඩසටහන නිර්මාණය කිරීම**

  ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල වැඩසටහන් සකස් කළ අතර මෙම වැඩසටහන ව්‍යාපාර
  කටයුතු නංවාලීම, කෘෂිකර්මාන්තය නවීකරණය, මූල්‍යමය සම්පත් භාවිතය සහ තරුණ පරපුර බලගැන්වීම තුළින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම අරමුණු කරගෙන ඇත.

- **ගාල්ල, මාතර, හම්බන්තොට, රත්නපුර සහ මොණරාගල යන දිස්ත්‍රික්ක ඉලක්ක කරමින් ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීමේ වැඩසටහන සඳහා ව්‍යාපෘති වාර්තාවක් පිළියෙල කිරීම**

ලංකාවේ දකුණු පළාතේ ඉහත දිස්ත්‍රික්ක වලට අයත් දුෂ්කර පළාත්වල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා අදාල වැඩසටහන් හදුනාගත් අතර ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර විදේශ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා යොමු කරන ලදී.

- **ග්‍රාමීය මට්ටමේ ආර්ථික කටයුතු පිළිබඳ සංගණනය සිදුකිරීම**

ඉහත කාර්යය සඳහා ආකෘති පත්‍රයක් සකස් කර එය දිස්ත්‍රික් සැලසුම් අධ්‍යක්ෂවරු හරහා සියළුම ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට බෙදා දුන් අතර අදාළ තොරතුරු රැස්කර ගන්නා ලදී.

- **ශ්‍රී ලංකාවේ ජාතික පවුල් ප්‍රතිපත්තිය සකස් කිරීම**

සමාජ බලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය විසින් ඉහත ප්‍රතිපත්තිය දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණය සඳහා යොමුකර තිබුණි. ඊට අදාළව, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සියළුම පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් පැවැත්වූ අතර දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණය දක්වා එම ප්‍රතිපත්තිය සංශෝධනය කළ යුතු අයුරු දක්වන ලදී.

- **ශ්‍රී ලංකාවේ ජාතික මානව සංවර්ධන වාර්තාව 2017**

ඉහත වාර්තාවේ කෙටුම්පත ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා යොමුකර තිබුණි. ඊට අදාල නිරීක්ෂණ සහ නිර්දේශ පිළිබඳව අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡාවන් පවත්වන ලද අතර එම වාර්තාවේ විශ්ලේෂණයන් සඳහා 2012/2013 වසරවල පැරණි දත්ත භාවිතා කර තිබීමේ ගැටළුව නිරාකරණය කරගැනීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) යන ආයතන සමඟ රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. අවසානයේ දී, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අදාළ දත්ත ලබා දීමට එකඟ වූ අතර 2015/2016 වසර වල නව දත්ත භාවිතා කර විශ්ලේෂණ කටයුතු නැවත සිදු කිරීමට UNDP හි එකඟතාවයද ලබාගන්නා ලදී.

- **සමාජ ආරක්ෂණ අංශය සහ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGS)**

සමාජ ආරක්ෂණ අංශයට අදාල SDGs; ඉලක්ක 4.2 (පෙරපාසල් ළමුන්) සහ ඉලක්ක 5 (කාන්තාවන්) සඳහා වන ඇගයීම් කටයුතු සිදුකර ඊට අදාළ දර්ශක ගොඩනැංවීම සඳහා නිරීක්ෂණ ලබා දෙන ලදී.

- **පශ්චාත් ආපදා ප්‍රතිසාධනය සහ නැවත ගොඩනැංවීමේ සැලැස්ම පිළිබඳ වාර්තාව; ගංවතුර සහ නායයෑම්; මැයි, 2017 සකස්කිරීම**

ඉහත වාර්තාව සැකසීම සඳහා සමාජ ආරක්ෂණ අංශයට අදාළ තොරතුරු සපයන ලදී. සමාජ ආරක්ෂණ අංශය යටතේ ප්‍රධාන වශයෙන් පෙර පාසල්, ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන, වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන, ආරක්ෂිත නිවාස, සිරමැදිරි,පුනරුත්ථාපන කාර්යාල සහ සමෘද්ධි බැංකු වලට ගංවතුර සහ නායයෑම් නිසා සිදු වූ හානි පිළිබඳව අවධානය යොමු කරන ලදී.

- **ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ග සකස්කිරීම සඳහා තාක්ෂණික සහයෝගීතාව ලබාගැනීමට ව්‍යාපෘති වාර්තාව සකස්කිරීම**

ජාතික සමාජ ආරක්ෂණ උපායමාර්ගයන් සකස් කිරීම;සමාජ ආරක්ෂණ ජාල(Social Safety Nets) ව්‍යාපෘතියේ 3C සංරචකය එමඟින් සමාජ ආරක්ෂණය පිළිබඳව උපායමාර්ගික පර්යේෂණ සඳහා මූල්‍යාධාර සපයයි. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මෙහි වගකිව යුතු ආයතනය වෙමින් ඉහත උපායමාර්ග සකස් කිරීම සඳහා කටයුතු කරනු ලබයි. මීට අදාළව, සමාජ ආරක්ෂණ උපායමාර්ග සැකසීම සඳහා තාක්ෂණික සහයෝගීතාව ලබාගැනීම සඳහා සංකල්ප පත්‍රයක් සකස් කරන ලදී.

- **සමාජ ආරක්ෂණ ජාල (Social Safety Nets) ව්‍යාපෘතිය සඳහා මෙහෙයුම් සංග්‍රහය සැකසීම**

ඉහත කටයුත්ත සඳහා සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ කළමණාකරණ ඒකකය සඳහා මඟ පෙන්වන ලදී.

- **සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ විෂය පථය (TOR)සකස් කිරීම**

ඉහත කටයුත්තට අදාළව TOR තුනක් පහත සඳහන් කාර්යයන් සඳහා සකස්කරන ලදී.

I.) ක්‍රියාකාරී කමිටුව පිහිටුවීම
II.) සමාජ ආරක්ෂණ ඇගයුම සඳහා උපදේශන සේවාව ලබා ගැනීම.
III.) සමාජ ආරක්ෂණ උපායමාර්ග සැකසීම සඳහා උපදේශන සේවාව ලබා ගැනීම.

- **එක්සත් ජාතීන්ගේ ජනගහන ක්‍රියාකාරකම් සඳහා අරමුදල (UNFPA) - කාන්තාවන් සවිබල ගැන්වීම සහ කාන්තා හිංසනය පිටුදැකීම සඳහා නිරීක්ෂණ සැපයීම**

ඉහත වැඩසටහනට අදාළව කාන්තාවන් බලගැන්වීම සඳහා ප්‍රධාන විෂය පථය හඳුනාගනිමින් ඒ සඳහා උපායමාර්ග සහ ක්‍රියාත්මක කළ යුතු වැඩසටහන් යෝජනා කිරීම.

- **ලෝක ආහාර වැඩසටහන සඳහා යෝජිත උපායමාර්ගික සැලැස්ම 2018 – 2022 සඳහා නිරීක්ෂණ සැපයීම**

ඉහත සැලැස්ම සඳහා අපගේ නිරීක්ෂණ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමුකරන ලදී.

- **"තිරසාර ශ්‍රී ලංකාවක් සඳහා දැක්ම 2030" (Sustainable Sri Lanka 2030 Vision)**

උක්ත ලේඛනය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද නිරීක්ෂණ සඳහා සමාජ ආරක්ෂණ අංශයට අදාල නිරීක්ෂණ සකස් කරන ලදී.

- **එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේ 72 වන සැසිවාරය, නිව්යෝක්, සැප්තැම්බර් 2017 - දෙවන කමිටුව සඳහා අවශය කරුණු දීම .**

උක්ත කරුණට අදාලව "ලිංගික සමානාත්මතාව සහ කාන්තාව බලගැන්වීම" මාතෘකාව යටතේ අවශ්‍ය කරුණු සහ තොරතුරු සපයන ලදී.

- **අයවැය අවශ්‍යතාවය සඳහා නිර්දේශ සැපයීම**

දැනට ක්‍රියාත්මක වන සහ නව ව්‍යාපෘති සහ වාර්ෂික වැඩසටහන් පිළිබඳව ලැයිස්තුවක් පිළියෙළ කර 2018 අයවැය ඇස්තමේන්තුගත කිරීම සඳහා එය ඉදිරිපත් කරන ලදී.

- **අත්‍යවශ්‍ය ව්‍යාපෘති (2018 – 2020) ලැයිස්තුව පිළියෙළ කිරීම**

" ව්‍යාපෘති 100 " සඳහා තෝරාගත් ව්‍යාපෘති ලැයිස්තුව සහ අදාළ ව්‍යාපෘති පිළිබඳව තොරතුරු සපයන ලදී.

- **ළමා රැකවරණ මධ්‍යස්ථාන ඇතිකිරීම සඳහා පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙළ කිරීම**

ඉදිරි වසර තුන (2018-2020) තුළ දිවා සුරැකුම් පහසුකම් ලබාගන්නා සිසුන් සංඛ්‍යාව 24,000 සිට 100,000 දක්වා ඉහළ නැංවීමට අදාලව ගුණාත්මක කාර්යය මණ්ඩලයක් බිහිකරලීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පුහුණු අවශ්‍යතාව හඳුනාගන්නා ලද අතර අදාල අමාත්‍ය මණ්ඩල සංදේශයේ කෙටුම්පත පිළියෙළ කර ගරු අමාත්‍යතුමාගේ අවධානය සඳහා ඉදිරිපත් කරන ලදී.

- **වැඩිහිටි රැකවරණ වෙබ් අඩවිය පිහිටුවීම සඳහා තාක්ෂණික සහයෝගිතාව ලබාගැනීමට සංකල්ප පත්‍රයක් නිර්මාණය කිරීම.**

  ඉහත වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ කාර්යයන් සඳහා දායකත්වය සපයන ලද අතර කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශයට අනුයුක්ත බාහිර විශේෂඥයින් යොදවා ගැනීම සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය පුහුණුව ලබාදීම යන කාර්යයන් සඳහා සංකල්ප පත්‍රයක් පිළියෙළ කරන ලදී.

- **රැස්වීම් සහ වැඩමුළු සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම**

  අදාළ අමාත්‍යාංශ මගින් සංවිධානය කරන ලද මෙහෙයුම් කමිටු, ප්‍රගති සමාලෝචන රැස්වීම් සහ වැඩමුළු සඳහා සහභාගී වීම සහ සමාජ ආරක්ෂණ අංශයේ උන්නතිය සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම.

**<u>ප්‍රාදේශීය සංවර්ධනය</u>**

පවත්නා ප්‍රාදේශීය විභවතාවත්, සුවිශේෂතා හා විවිධතා හඳුනාගනිමින් සෑම ප්‍රජාවකගේම ජීවන තත්ත්වයක් ඉහළ මට්ටමකට දියුණු කිරීම ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ජාතික ප්‍රතිපත්තිය වේ.
ජාතික මට්ටමේ සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනිම සඳහා ඒ ඒ පළාත්වල පවතින සම්පත් ප්‍රශස්ත හා තිරසාර මට්ටමින් භාවිතයට ගැනිමේ වැදගත්කම මෙම අංශය මගින් අවධාරණය කෙරේ. ආර්ථික වර්ධන වේගය, මානව සංවර්ධන දත්ත, සමාජ දත්ත හා ඒවායේ කාලීන වෙනස්කම් විශ්ලේෂණය කිරිමේදී පළාත් 9 තුළ පවතින මූලික සංවර්ධන ගැටළු, විෂමතාවන් හා අභියෝගයන් පිළිබඳව අනාවරණය වේ. ඒවා අතුරින් ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන් කෙරෙහි අවධානය යොමු කිරිම ඉතා වැදගත්වන අතර එය අදාළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය, මානව සංවර්ධන දර්ශකය, කාර්මීකරණ මට්ටම, කෘෂිකාර්මික හා යටිතල පහසුකම් සංවර්ධන මට්ටම යන කාරණා සමඟ සමීපව බැඳී පවතී.බොහොමයක් ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් අදාළ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ මගින් සිදු කරණු ලැබේ. අදාළප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලෙස, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (කොළඹ, ගම්පහ, හා කළුතර දිස්ත්‍රික්ක) , නිතීය හා සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය ( ගාල්ල, මාතර, හම්බන්තොට, මොණරාගල හා රත්නපුර දිස්ත්‍රික්ක) , අභ්‍යාන්තර කටයුතු , වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (කුරුණෑගල, පුත්තලම හා කෑගල්ල දිස්ත්‍රික්ක) , බන්ධනාගාර ප්‍රතිසංස්කරණය, පුණුරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හිංදු ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය (යාපනය, කිලිනොච්චිය, වව්නියා, මන්නාරම හා මුලතිව් දිස්ත්‍රික්ක) , ප්‍රාදේශිය සංවර්ධන අමාත්‍යාංශය ( මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල, අනුරාධපුර, ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්ක) වේ.
ප්‍රාදේශීය සංවර්ධන විෂමතා අවම කිරීම පිළිබඳව නිදහසින් පසු සියළුම පාලන තන්ත්‍රයන් හී අවධානය යොමු වී ඇත.කඩිනම් මහවැලි සංවර්ධන වැඩසටහන, දිස්ත්‍රික් සංවර්ධන කමිටු පිහිටුවීම, පළාත් සභා හා පලාත් පාලන ක්‍රමය ස්ථාපිත කිරිම, ගම් උදාව වැඩසටහන, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරිම, ප්‍රාදේශිය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන දියත් කිරිම, ගම නැගුම හා පුරනැගුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශිය සංවර්ධන විෂමතා අවම කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් කිහිපයකි. ප්‍රාදේශීය සංවර්ධන අංශය අනෙකුත් අංශ ගණනාවක් සමඟ ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන බැවින් එකී අංශ මගින් ක්‍රියාත්මක කරන වැඩසටහන් ද ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා වැදගත් වේ.

**විශේෂ කාර්යයන්**

- රේඛීය අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශ සඳහා කැබිනට් නිරීක්ෂණ 2ක් ඉදිරිපත් කරන ලද අතර ව්‍යාපෘති යෝජනා 05 ක් ඇගයීමට ලක් කර ඇත.
- ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අදාළ රේඛීය ආයතන වෙත නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.
- සිංහරාජා විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2018-2020 සකස් කරන ලදි.

- පශ්චාත් ආපදා ප්‍රතිසාධනය සහ ප්‍රතිසංස්කරණ සැලසුම (ගංවතුර හා නායයාම මැයි 2017)සකස් කරන ලදී.
- දක්ෂිණ සංවර්ධන සැලැස්ම සකස්කිරීමට සහාය වීම.
- උතුරු සංවර්ධන සැලැස්ම සකස් කිරීමට සහාය වීම.

## 3.9 රාජ්‍ය කළමනාකරණය හා පාලන

රාජ්‍ය කළමනාකරණයේ ප්‍රධාන උපායමාර්ගය වනුයේ කාර්යක්ෂම හා මහජන හිතවාදී සේවාවක් සැපයීමට හැකිවනු පිණිස නවීන තාක්ෂණික ක්‍රම භාවිතය හා රාජ්‍ය සේවයේ ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් කළමනාකරණ ක්‍රමවේද හා පරිපාලන ක්‍රම වෙනස් කිරීම වේ.

කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවාවක් සැපයීම සඳහා රාජ්‍ය සේවය තුළ ආයතනික, මානව සහ සේවා සැපයීමේ ඵලදායිත්වය යන අංශයන්හි ක්‍රමික වර්ධනයක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. පෞද්ගලික අංශය සංවර්ධන කාර්යයේ යෙදවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අරමුණු කරගෙන රාජ්‍ය අංශය කැපී පෙනෙන කාර්යභාරයක් ඉටුකරනු ලබයි. මේ නිසා ඵලදායී හා කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා රාජ්‍ය අංශයේ මානව හා ප්‍රාග්ධන යන දෙකෙහිම ධාරිතා වර්ධනය ඉතා වැදගත් වේ. මෙම දෙපාර්තමේන්තුවේ රාජ්‍ය කළමනාකරණ හ පාලන අංශය ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර 5 ක් ආවරණය කරනු ලබයි. එනම් රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, නීතිය හා සාමය සහ විදේශ කටයුතු සහ ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ පාර්ලිමේන්තුව ඇතුළු රාජ්‍ය කළමනාකරණ අංශය යටතට ගැනෙන විශේෂ වියදම් ශීර්ෂ වේ. පසුගිය වසර තුළ මෙම අංශයේ වර්ධනය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව පහත සඳහන් පරිදි දායක වී ඇත.

- ව්‍යාපෘති යෝජනා 44 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, නිර්දේශ කිරීමේ ලිපි විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යවන ලදී.
- රාජ්‍ය කළමනාකරණ අංශයට අයත් විවිධ අමාත්‍යාංශවලින් ලැබුණු අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදී.
- අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් මෙහෙයවන ලද මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා සහභාගී වීම සහ එම ආයතනවල වර්ධනය සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- 2017 මැයි මාසයේ සිදු වූ ගංවතුර හා නායයෑම් සම්බන්ධව සකස් කරන ලද පශ්චාත් ආපදා කළමනාකරණ හා ප්‍රතිසංස්කරණ සැලසුම සඳහා රාජ්‍ය කළමනාකරණ අංශයට අදාළ ව දත්ත සකස් කිරීම හා එම ක්ෂේත්‍රය සම්බන්ධව වාර්තාවක් සකස් කිරීම.
- ප්‍රතිපත්ති සහ උපායමාර්ග සැකසීම සඳහා අදාල අමාත්‍යාංශ වෙත සහාය ලබාදීම.

## 3.10 විමධ්‍යගත අයවැය

<u>විමධ්‍යගත අයවැය වැඩසටහන</u>

1. ජාතික ලැයිස්තු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන කළමණාකරණය කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් තාක්ෂණික සහය ලබාදෙයි. මෙම වැඩසටහන මඟින් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ආගමික හා සමාජීය සංවර්ධනය, රැකියා උත්පාදනය හා වෘත්තීය පුහුණු ලබා දීම තුළින් ප්‍රාදේශීය සංවර්ධනය

අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන යටතේ 2017 වර්ෂය සඳහා රුපියල් මිලියන 290 ක ප්‍රතිපාදන වෙන් කර ඇත (එක් මන්ත්‍රීවරයෙක් සඳහා රුපියල් මිලියන 10 බැගින්). 2017 දෙසැම්බර් 31 දක්වා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 283ක් වටිනාකමකින් යුත් ව්‍යාපෘති 1909 ක් අනුමැතිය සඳහා නිර්දේශ ලබා දී ඇත.

**2. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ නිර්දේශ කරන ලද ව්‍යාපෘති**

| ව්‍යාපෘති වර්ගීකරණය | ව්‍යාපෘති ගණන | වටිනාකම (රු.මි.) |
|---|---|---|
| යටිතල පහසුකම් - රු. ලක්ෂ 2ට වඩා වැඩි වටිනාකම් සහිත ව්‍යාපෘති | 645 | 189 |
| යටිතල පහසුකම් - රු. ලක්ෂ 2ට වඩා අඩු වටිනාකම් සහිත ව්‍යාපෘති | 245 | 21 |
| මිළදිගැනීම් හා වෙනත් | 1019 | 73 |
| **එකතුව** | **1909** | **283** |

**4. සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය**

<u>සංවර්ධන තොරතුරුමධ්‍යස්ථානය</u>

සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය ආර්ථික සංවර්ධනය, සැළසුම්කරණය හා ඒ ආශ්‍රිත විෂයන්ට අදාළව පොත්පත් හා තොරතුරු සැපයීමේ විශේෂ පුස්තකාලයක් ලෙස ක්‍රියා කරයි. මුදල් අමාත්‍යාංශය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල නිලධාරීන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලන පුස්තකාලයක් ලෙස සංවර්ධන තොරතුරු මධ්‍යස්ථානය හඳුන්වාදිය හැක. එසේම තොරතුරු සොයා පැමිණෙන විශ්වවිද්‍යාල සිසුන්ට හා පර්යේෂකයින්ට මෙම ආයතනයේ සේවාව ලබාගත හැක.

**පුස්තකාල සංවිධානය**

- පිටතින් ලැබෙන සියලුම පොත්පත්, ලිපිලේඛන පුස්තකාලයට අත්කර ගැනීම සහ පරිශීලනයට පහසුවන ලෙස වර්ග කිරීම.
- සඟරා අංශය වැඩිදියුණු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා ග්‍රන්ථ හා ලිපිලේඛන ක්‍රමවත්ව සැකසීම.

**<u>බොදාහැරීම්, විමසීම් සහ විමර්ශන සේවා</u>**

- තොරතුරු අවශ්‍යතා විමසීම් ගැන කටයුතු කිරීම.
- පරිගණක දත්ත උපයෝගී කරගෙන තොරතුරු ගවේෂණ සැකසීම.
- තොරතුරු ප්‍රවර්ධනය සඳහා පරිගණක භාවිතා කොට බෙදා හැරීමට කටයුතු කිරීම.
- පුස්තකාලය භාවිතා කරන අයගේ අවශ්‍යතා අනුව පුවත්පත් ලිපි සඟරා සුපරීක්ෂණය කිරීම.

**<u>අනෙකුත් සේවාවන්</u>**

- සංවර්ධනතොරතුරුමධ්‍යස්ථානයේ සංඛ්‍යාංකකරණය කරන ලද එකතුව මගින් සේවා සැපයීම.
- වාර සඟරා ඒකාබද්ධ සූචිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.

- සම්මත ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ජාතික පුස්තකාලය සහ ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද පුස්තකාල ජාලයන්හි විවිධ කාර්යයන්ට දායකවීම.
- අන්තර් පුස්තකාල හුවමාරු ක්‍රමය පවත්වාගෙන යාම.

**5. මානව සම්පත් සංවර්ධනය සහ සාමාන්‍ය පරිපාලනය**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එස්.එස්.මුදලිගේ මයා | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | කේ.ඩී.එස්.ආර්.පෙරේරා මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | සී.එස්.පෙරේරා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 04 | එම්.ගංගාදරන් මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 05 | එස් .ඩී .රත්නායක මිය | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 06 | එන්.විජේවීර මිය | අධ්‍යක්ෂ (මුදල්) |
| 07 | යූ.එන්.මල්ලවාරච්චි මයා | අධ්‍යක්ෂ |
| 08 | සී.සේනානායක මිය | අධ්‍යක්ෂ |
| 09 | ටී.ඒ.ඩී.ඩී.ප්‍රේමරත්න මයා | අධ්‍යක්ෂ |
| 11 | ටී.එම්.ජේ.බණ්ඩාර මයා | අධ්‍යක්ෂ |
| 12 | ඒ.කේ. ගුණසේකර මිය | අධ්‍යක්ෂ |
| 13 | එම්.එෆ්.ඒ.මුබාරක් මයා | අධ්‍යක්ෂ |
| 14 | පී.එම්.එම්.ගුණරත්න මයා | අධ්‍යක්ෂ |
| 15 | ඒ.ආර්.වික්‍රමරත්න මයා | අධ්‍යක්ෂ |
| 16 | පී.එච්.චන්දිමා මිය | අධ්‍යක්ෂ |
| 17 | ටී. ප්‍රශාන්ත් මිය | අධ්‍යක්ෂ |
| 18 | ඩී.ඒ.නිහරේපොල මිය | සහකාර අධ්‍යක්ෂ |
| 19 | පී.එම්.එස්.ජයතිලක මයා | සහකාර අධ්‍යක්ෂ |
| 20 | කේ.එන්.පී.ජයරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 21 | ටී.එම්.ඩී.පී.තෙන්නකෝන් මයා | සහකාර අධ්‍යක්ෂ |
| 22 | ඩබ්.එල්.පී .ප්‍රනාන්දු මිය | සහකාර අධ්‍යක්ෂ |
| 23 | ආර්.කේ.එල් ජාගොඩ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 24 | ටී.වයි.එල්.මුණසිංහ මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 25 | ආර්.ඩී.ඒ.මෛත්‍රීරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 26 | ජී.ආර්.සී.හේවාවසම් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 27 | එම්.ඒ.ජී.තුෂාරි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 28 | ඩී.ඒ.සී.ඩී.පීරිස් මිය | සහකාර අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| 29 | ඩබ්.ඒ.ජේ.සී.වික්‍රමාරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 30 | ඒ.ලක්ෂ්මන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 31 | ඩී.ඒ.මනෝරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 32 | ඩබ්.ඒ.වල්පිට මිය | සහකාර අධ්‍යක්ෂ |
| 33 | ඩී.එච්.ආර්.ඩී.විජේවර්ධන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 34 | කේ.ජී.ආර්.ජී.ආර්.වික්‍රමවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ |
| 35 | අයි.ටී.එන්.මෙන්ඩිස් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 36 | එච්.ඩී.එන්.කේ. හෙට්ටිආරච්චි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 37 | කේ. ඒ.එච්.කේ පෙරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 38 | එස්.එම්.ඩී.ඩී.සමරකෝන් මිය | සහකාර අධ්‍යක්ෂ |
| 39 | ඩබ්.එම්.හංසනී මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 40 | කේ.බී.එස්.එස් ප්‍රනාන්දු | සහකාර අධ්‍යක්ෂ |
| 41 | කේ. ඒ.එම්.පි චන්ද්‍රපාල | සහකාර අධ්‍යක්ෂ |
| 42 | එම්.ජී.පී.කේ.ටී.ගුණවර්ධන මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 43 | කේ.ඩී.සී.තාමරසී මිය | සහකාර අධ්‍යක්ෂ |
| 44 | ජී.ආර්.එස්.එස්.තිලකරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 45 | යූ.ඒ.ඩබ්.එල්.සුමනසේකර මිය | සහකාර අධ්‍යක්ෂ |
| 46 | පී.ඒ.එන්.අබේසේකර මෙය | සහකාර අධ්‍යක්ෂ |
| 47 | එම්.ඒ.එස්.දබරේරා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 48 | ජේ.එම්.ඒ.කේ.ජයසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 49 | ජී.රත්නාවලී මිය | සංවර්ධන නිලධාරි |
| 50 | එස්.බී.සමරසේකර මිය | සංවර්ධන නිලධාරි |
| 51 | කේ.ජී.පී.දමයන්ති මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 52 | එම්.ඩී.චන්ද්‍රා මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 53 | ජේ.ඒ.ඩී.සී.ජයකොඩි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 54 | ඒ.ඩී.එන්.ප්‍රියදර්ශනී මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 55 | කේ.එල්.ඩබ්.සී.එල්.ද සිල්වා මෙය | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 56 | වයි.ජී.එස් පියදර්ශනි | රාජ්‍ය කළමනාකරන සහකාර 1 |
| 57 | ඒ.ඩී.එන්. මෙලානි මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 58 | එන්.ඊ. ලියනගේ මිය | රාජ්‍ය කළමනාකරන සහකාර 11 |
| 59 | පී.එස්.ආර්.පීරිස් මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 60 | පී.ඩබ්.එන්.එස්. පතිරාජ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 61 | ඊ.ඒ.සී.එස්. එදිරිසිංහ මයා | රාජ්‍ය කළමනාකරන සහකාර 111 |
| 62 | කේ.වී.ඩී.ඒ.පී.කරවිට මයා | රියදුරු 1 |
| 63 | ඒ.එම්. ලලිත් දීපාල් මයා | රියදුරු 1 |

| | | |
|---|---|---|
| 64 | පී.එස්.ආනන්ද මයා | රියදුරු 1 |
| 65 | එච්.පී.ආර්.සමරසිංහ මයා | රියදුරු 1 |
| 66 | එස්.ජයසූරියර් මයා | රියදුරු 11 |
| 67 | ඩබ්.එම්.එන්. කරුණාතිලක මයා | රියදුරු 11 |
| 68 | සුනිල් ලියනආරච්චි මයා | රියදුරු 11 |
| 69 | ජේ.ජී.යූ. විමලසිරි මයා | රියදුරු 11 |
| 70 | ඩී.බී.දිසානායක මයා | රියදුරු 11 |
| 71 | ඊ.ඒ.එස්.එස්. එදිරිසිංහ මයා | රියදුරු 11 |
| 72 | ඩී.ජී.බැසිල් සමන්ත මයා | රියදුරු 11 I |
| 73 | පී.ධර්මසිරි මයා | කා.සේ.සේ විශේෂ ශ්‍රේණිය |
| 74 | නිමල් රංජිත් හෙට්ටි ආරච්චි මයා | කා.සේ.සේ විශේෂ ශ්‍රේණිය |
| 75 | යූ.උපුල් රත්නකුමාර මයා | කා.සේ.සේ විශේෂ ශ්‍රේණිය |
| 76 | ඩබ්.එන්.බොතේජු මහතා | කා.සේ.සේ.1 |
| 77 | එම්.ඒ.එල්.නලීන් මයා | කා.සේ.සේ. 1 |
| 78 | පි.එස්. අජිත් මයා | කා.සේ.සේ. 1 |
| 78 | එම්.පී.ආර්.රත්නායක මයා | කා.සේ.සේ. 1 |
| 79 | ඩබ්.එස්.යූ.කේ. සිල්වාමයා | කා.සේ.සේ. 1 |
| 80 | එම්.චන්දන ප්‍රදීප් මයා | කා.සේ.සේ. 11 |

**2017 වර්ෂයේ ස්ථාන මාරුවී පැමිණි නිලධාරින්**

| අනුඅංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | පී.එම්.එම්.මහින්ද මයා | අධ්‍යක්ෂ |
| 02 | ජී.ආර්.එස්.තිලකරත්න මිය | සහකාර අධ්‍යක්ෂ |
| 03 | වයි.ජී.එස්.ප්‍රියදර්ශනී මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර 1 |

**2017 වර්ෂයේ ස්ථාන මාරුවී ගිය නිලධාරින්**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | ආර්.එච්.සී.කේ.රාමසිංහ මිය | සහකාර අධ්‍යක්ෂ |
| 02 | ඩබ්.ඩී.පී.ප්‍රනාන්දු මිය | රා.ක.ස. 1 |
| 03 | ඩී.එම්.එස්.නිශාන්ත මයා | රියදුරු 111 |
| 04 | එම්.ඩී.ආර්.ප්‍රනාන්දු | කාර්යාල සේවක සේවය 1 |
| 05 | ඒ.එම්.ආර්.එස්.ධම්මිකකුමාර මයා | කාර්යාල සේවක සේවය 1 |
| 06 | එස්.ඉරුදයරාජ් මයා | කාර්යාල සේවක සේවය 1 |

| | | |
|---|---|---|
| 07 | ඩී.එම්.උපුල් කුමාර මයා | කාර්යාල සේවක සේවය 1 |
| 08 | ජී.එස් රොහණ | කාර්යාල සේවක සේවය 1 |
| 09 | ඩබ්.ජී.එස්.බී.තෙන්නකෝන් මයා | කාර්යාල සේවක සේවය 1II |

**2017 වර්ෂයේ විශ්‍රාම ගිය නිලධාරින්**

| **අනු අංකය** | **නිලධාරියාගේ නම** | **තනතුර** |
|---|---|---|
| 01 | ඩී.ඒ.විජේතුංග මයා | රියදුරු 1 |

**විදේශීය පුහුණු සඳහා සහභාගි වීම - 2017 වර්ෂය**

| නිලධාරියාගේ නම | සහභාගි වූ පුහුණුව | පුහුණුව පැවැත්වුණු කාලසීමාව | පුහුණුව පැවැත් වුණු රට |
|---|---|---|---|
| එස්.එස්. මුදලිගේ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල් | තායිලන්තයේ පැවති Counterpart Study Visit Program in Thailand on Agricultural Value Chain Development with Focus on Strategies for Agricultural Standards වැඩමුළුව<br><br>පිලිපීනයේ පැවති ADB Annual Country Consultation. ADB Headquarters,වැඩමුළුව<br><br>Study Tour, Joint Coordination වැඩසටහන<br><br>Committee Meeting<br><br>.Investor Forum and Knowledge Sharing Program,<br><br>Annual Consultation Meeting (ACM) | ජනවාරි 09සිට 15 දක්වා<br><br>මාර්තු 9 -10<br><br>අප්‍රේල් 01-08<br><br>මැයි 9<br><br>ජූනි 26සිට 30දක්වා<br><br>ජූලි 08-13 දක්වා<br><br>ඔක්තෝම්බර් 12-13 දක්වා<br><br>**ඔක්තෝම්බර්** 01සිට05දක්වා | තායිලන්තය.<br><br>පිලිපීනයේ මැනිලා<br><br>රීයුනියන් අයිලන්ඩ්<br><br>ස්ලාම්බාද්නුවර<br><br>දකුණු කොර්යාවේ සෝල් හිදී<br><br>ප්‍රංශය<br><br>ඉන්දියාවේ නවදිල්ලි නුවර<br><br>පිලිපීනය . |

| | | | |
|---|---|---|---|
| | 2017-with the government of France<br><br>Inception Meeting of SASEC Cross-border power Trade Working Group<br><br>The Regional Knowledge Exchange: Implementing the Agenda 2030 for Sustainable Development | | |
| කේ.ඩී.එස්.ආර්. පෙරේරා මයා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Participate the 3rd BIOFIN Regional Workshop for Europe, Asia and the Pacific, 2017.<br><br>Sea Regional Forum to Accelerate NCDs Prevention and Control in the Contest of the SDGs Bangkok | ඔක්තෝම්බර් 09 -11 දක්වා | කසකස්තානය<br><br>තායිලන්තය |
| සී.එස් පෙරේරා මහතා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Model - Based Monetary Policy Analysis and Forecasting (MPAF Singapore) | මැයි 01සිට 12දක්වා | සින්ගප්පූරුව |
| එම්.ගංගාදරන් මිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | Capacity Building Workshop on Integrating Social Protection Indicators in Monitoring Sustainable Development Goals-ADB Headquarters,<br><br>Participation in the SASEC Finance Ministers' Meeting<br><br>.Investor Forum and Knowledge Sharing Program,<br><br>Modernization and transformation Programme (The | මාර්තු 14-15<br><br>අප්‍රේල් 03<br><br>ජුනි 26 සිට 30 දක්වා<br><br>සැප්තැම්බර් 10-16 දක්වා<br><br>සැප්තැම්බර් 18-29 දක්වා<br><br>ඔක්තෝම්බර් 26-27 දක්වා | මැනිලා<br><br>ඉන්දියාවේ නවදිල්ලි<br><br>කොරියාවේ සෝල් හිදී<br><br>මැලේසියාව<br><br>ජපානය<br><br>පිලිපීනය |

| | | | |
|---|---|---|---|
| | Milesian Experience) for the Planning Officer from Sri Lanka<br><br>Program on Urban Public Transport Planning & Management<br><br>Regional Asia Women Leaders Programme | | |
| ජේ.එම්.එස්.ඩී. රත්නායක මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | .Counterpart Study Visit Program in Thailand on Agricultural Value Chain Development with Focus on Strategies for Agricultural Standards -<br><br>Regional Training Workshop on Meddling Tools to Support International Decision Making<br><br>Third Edition of the World Reconstruction Conference, Modernization and transformation<br><br>Programme (The Milesian Experience) for the Planning Officer from Sri Lanka | ජනවාරි 09සිට 15 දක්වා<br><br>මාර්තු 6-10 දක්වා<br><br>ජූනි 7- 8 දක්වා<br><br>සැප්තැම්බර් 10-16 දක්වා | තායිලන්තය<br><br>තායිලන්තය<br><br>බ්‍රසීලය.<br><br>මැලේසියාව |
| එන්. විජේවීර මෙනවිය<br>අධ්‍යක්ෂ (ගිණුම්) | Training Course on Financial Programming and Policies. | ජූනි 19සිට 30 දක්වා | ඉන්දියාව |
| යූ.එන්.මල්ලවආරච්චි මයා<br>අධ්‍යක්ෂ | Training Programme on Strengthening Public Policy Making Process for Staff of the Ministry of Finance , | මාර්තු 20සිට 24දක්වා<br><br>නොවැම්බර් 9සිට 10 දක්වා 2017, | ඕස්ට්‍රේලියාව<br><br>තායිලන්තය |

| | | | |
|---|---|---|---|
| | ADB-UNESCAP – SASEC Knowledge Event on Transport Facilitation | | |
| සී සේනානායක මිය අධ්‍යක්ෂ | Executive Training Programme for the staff of Ministry of Finance – Singapore ,<br><br>participate the Japan Under JICA Preparatory Survey for the Health and Medical service Improvement Project<br><br>Study Tour to Rwanda | පෙබරවාරි13 සිට 17දක්වා 2017<br><br>ජූනි 25සිට ජූලි 01 දක්වා 2017<br><br>අගෝස්තු 27 සිට30 දක්වා2017 | සිනගප්පූරුව<br><br>ජපානය<br><br>රුවන්ඩාව |
| ටී.ඒ.ඩී.ඩී. ප්‍රේමරත්න මහතා<br>අධ්‍යක්ෂ | ICT for Education,<br><br>Management of Industrial Park for sri lanka | මාර්තු 03 සිට08 දක්වා 2017<br><br>නොවැම්බර් 06 සිට 26 දක්වා 2017 | දකුණු කොරියාව |
| ටී.එම්.ජේ. බණ්ඩාර මහතා<br>අධ්‍යක්ෂ | Training Programme on Strengthening Public Policy Making Process for Staff of the Ministry of Finance Australia,<br><br>Leveraging Big Data for Sustainable Development.<br><br>Sharing Best Practices on the Implementation of Gender Responsive Planning and budgeting in | ජූනි 27සිට 29 දක්වා 2017<br><br>ජූනි 27 සිට29 දක්වා 2017<br><br>සැප්තැම්බර් 25 සිට ඔක්තෝම්බර් 01 දක්වා 2017 | ඕස්ට්‍රේලියාව<br><br>කෙන්යාව<br><br>ඉන්දුනීසියාව |
| ඒ කේ ගුණසේකර මෙය<br>අධ්‍යක්ෂ | 12th Asia Clean Energy Forum – | ජූනි 5 සිට 8 දක්වා 2017<br><br>ඔක්තෝම්බර් 12 සිට | පිලිපීනයේ මැනිලා නුවර<br><br>ඉන්දියාවේ නවදිල්ලි |

| | | | |
|---|---|---|---|
| | Meeting of SASEC Cross-border power Trade working Group | 13 දක්වා 2017, | නුවර |
| එම් එෆ් ඒ මුබාරක් මහතා<br>අධ්‍යක්ෂ | The Regional Dialogues on (Intended) Nationally Determined Contribution -<br><br>Training Programme on Strengthening Public Policy Making Process for Staff of the Ministry of Finance,<br><br>Japan Under the JICA Data Collection Server on DRR Sector<br><br>Third Integrated Urban Development Program: Smart Cities The French Experience | පෙබරවාරි 21 සිට 23 දක්වා 2017,<br><br>මාර්තු 20සිට 24 දක්වා<br><br>අප්‍රේල් 02 සිට 08 දක්වා 2017<br><br>ඔක්තෝම්බර් 9 සිට 12 දක්වා 2017 | තුර්කිය<br><br>ඕස්ට්‍රේලියාව<br><br>ජපානය<br><br>ඉන්දියාවේ චන්දිගාර් |
| ඒ ආර් වික්‍රමරත්න මහතා<br>අධ්‍යක්ෂ | Study visit on Agriculture Value Chain Development, Thailand 8 -16 January 2017.<br><br>Loan Negotiation Saudi Funds – Saudi Arabia, 26-30 March 2017<br><br>The Regional Advocacy Event for Monitoring the Sustainable Development Goals (SDGs) related to Food and Agriculture, 4-8 September 2017, Bangkok, Thailand And Demonstration | ජනවාරි 8 සිට16 දක්වා<br><br>මාර්තු 26 සිට 30 දක්වා<br><br>සැප්තැම්බර් 4 සිට 8 දක්වා | තායිලන්තය<br><br>සවුදි අරාබියාව<br><br>තායිලන්තය |

| | | | |
|---|---|---|---|
| | Workshop on tools for monitoring Food Security (SDG 2) | | |
| ටී. ප්‍රශාන්ත්<br>අධ්‍යක්ෂ | Traning Course public Investment Managment | 4 සිට 8 දෙසැම්බර් | නව දිල්ලි<br>ඉන්දියා |
| චන්දිමා පුංචිහේවා මිය<br>අධ්‍යක්ෂ | Executive Training Programme on Strategic Human Resource Management Le Kuan Yew School of Public policy NUS Singapore | පෙබරවාරි 13 සිට 17 දක්වා 2017 | සිංගප්පූරුව |
| *පී.එම්.එස්.ජයතිලක මහතා<br>සහකාර අධ්‍යක්ෂ* | *Fiscal Analysis & Forecasting.*<br><br>*Project for Formulating Cascade System Development Plan.*<br><br>*UN-REDD Asia Pacific Regional Knowledge Exchange Forum 2017 " Operationalizing and financing National REDD + Strategies From financing implementation to Results-Based Payments for REDD+"*<br>*To be held* | *මාර්තු 20 සිට 31 දක්වා 2017*<br><br>*මැයි 14 සිට 27දක්වා 2017*<br><br>*ඔක්තෝම්බර් 10 සිට 12 දක්වා 2017* | *ඉන්දියාව*<br><br>*ජපානය*<br><br>*තායිලන්තයයේ බැංකොක් නුවර* |
| කේ.එන්.පී. ජයරත්න මහතා<br>සහකාර අධ්‍යක්ෂ | Delegation- Member.<br><br>Comprehensive Urban Transportation Planning | පෙබරවාරි 05 සිට 10 දක්වා 2017<br><br>ඔක්තෝම්බර් 18 සිට දෙසැම්බර් 16 දක්වා | කොරියාව<br><br>ජපානය |
| දිස්නා අවන්ති නිහරේපොල මිය<br>සහකාර අධ්‍යක්ෂ | Australia Awards Scholarships - Academic Year 2017 Intake | Year 2017 | ඕස්ට්‍රේලියාව |
| පරාක්‍රම තෙන්නකෝන් මහතා<br>සහකාර අධ්‍යක්ෂ | Macro econometric Forecasting & Analysis - From 07th | අගෝස්තු 07 සිට 18<br><br>අගෝස්තු 07සිට18 | වියට්නාමය |

| | | | |
|---|---|---|---|
| | to 18th August 2017 Vietnam.<br><br>The Macro econometric Forecasting and Analysis. | දක්වා | සිංගප්පූරුව |
| ලක්මිණි ප්‍රියන්ති ප්‍රනාන්දු මිය<br>සහකාර අධ්‍යක්ෂ | South Asia sub regional Economic Cooperation (SASEC) Customs Subgroup- From 14-15 June 2017, Thimbu, Bhutan.<br><br>Doctor of Philosophy (Economics), the University of Adelaide. | ජූනි 14-15<br><br>2017 අප්‍රේල් සිට 2020 ඔක්තෝම්බර් දක්වා | භූතානයේ තිම්පු හිදී<br><br>ඕස්ට්‍රේලියාව |
| රජිතා කිසාගෝතමී ලංකාතිලක මිය<br>සහකාර අධ්‍යක්ෂ | Scholarship to study MSc Climate Justice (FT) at the, Glasgow Caledonian University, UK (Master's Degree) | 2017 වසර | එක්සත් රාජධානිය |
| ටී.වයි.එල්.මුණසිංහ මිය<br>සහකාර අධ්‍යක්ෂ | Study visit on Agriculture Value Chain Development. | ජනවාරි 8 -16 | තායිලන්තය |
| ආර්.ඩී.ඒ මෛත්‍රිරත්න මහතා<br>සහකාර අධ්‍යක්ෂ | 49. Investor Forum and Knowledge Sharing Program- Republic of Korea,<br><br>"Macroeconomic Management for effective governance and sustainable inclusive economic growth (Sri Lanka)" | ජූනි 29 සිට සැප්තැම්බර් 23දක්වා<br><br>නොවැම්බර් 20 සිට දෙසැම්බර් 15 දක්වා | ඕස්ට්‍රේලියාව<br><br>ජපානය |
| ඩී.ඒ.සී.ඩී. පීරිස් මිය<br>සහකාර අධ්‍යක්ෂ | Second Health sector Development Project- Training on Planning and Management of | ජූනි 6 සිට14 2017<br><br>සැප්තැම්බර් 09 සිට | බැංකොක්, තායිලන්තය |

| | | | |
|---|---|---|---|
| | Health Project,<br><br>MA in Health Management, Planning and Policy in University of Leeds | 2017 to සැප්තැම්බර් 08 දක්වා 2018 | එක්සත් රාජධානිය |
| අහල්යා ලක්ෂ්මන්<br>සහකාර අධ්‍යක්ෂ | Training Course on publick Investment Management form | 4සිට8<br>දෙසැම්බර් | නව දිල්ලි<br>ඉන්දියා |
| ඩී.ඒ මනෝරත්න මිය<br>සහකාර අධ්‍යක්ෂ | Training Course on Managing Capital Flows: Macroeconomic Analysis and Policies - Invitation for Participation that will be held<br><br>The E-Learning: Asian Economic Development and Integration 29th November 2017 and 20th Annual Conference 2017 | සැප්තැම්බර් 11 සිට 15 දක්වා 2017,<br><br>නොවැම්බර් 30 සිට දෙසැම්බර් 01 දක්වා 2017 | ඉන්දියාව<br><br><br>ජපානය<br>ටෝකියෝ |
| කේ ජී ආර් ජී ආර් වික්‍රමවර්ධන මහතා<br>සහකාර අධ්‍යක්ෂ | Financial Development and Financial Inclusion (FDFI) | ඔක්තෝම්බර් 09සිට 20 | සිංගප්පූරුව |
| තිලිනි මෙන්ඩිස් මිය<br>සහකාර අධ්‍යක්ෂ | Sufficiency Economy Philosophy towards a Sustainable Development , | මාර්තු12 සිට 26 දක්වා 2017 | තායිලන්තය |
| කේ .එ. එච්. කේ පෙරේරා<br>සහකාර අධ්‍යක්ෂ | TA 7676 : Capacity Development for Water Supply & Sanitation Service Delivery - Proposed Exposure Visit Movement Officials of Sri Lanka Invitation to Visit Desalination Plant and Study Tour | අප්‍රේල් 24 සිට 29 දක්වා 2017 | ඕස්ට්‍රේලියාව |
| ඩබ්.ඒ හංසනී මිය<br>සහකාර අධ්‍යක්ෂ | Training Course on Quarterly National Account Statistics | ජූනි 12 සිට16 දක්වා2017 | ඉන්දියාව |
| කේ. බී එස් එස් ප්‍රනාන්දු මහතා | Master's Degree in Infrastructure | 2017-2019 | ජපානය |

| | | | |
|---|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ | Management Programmer – Yokohama National University | | |
| මංජුල චන්ද්‍රපාල මහතා<br>සහකාර අධ්‍යක්ෂ | Development Cooperation Policy Program (DCPP) at the Graduate School of International Studies, Seoul National University | 2016-2017 | කොරියාව |
| වසුන්දරා සුමනසේකර මිය<br>සහකාර අධ්‍යක්ෂ | 2017 Seminar on planning and Construction of Smart City for Developing Countries | අගෝස්තු14 සැප්තැම්බර්12 දක්වා 2017 | චීනය |
| නිලූෂා අබේසේකර මිය<br>සහකර අධ්‍යක්ෂ | . The study visit on Young Leaders Training Programmed - disaster Management<br><br>Australia Awards Scholarship | ජනවාරි 30 සිට පෙබරවාරි 17දක්වා 2017<br><br>ජනවාරි 11 2018 සිට දෙසැම්බර් 31දක්වා 2019 | ජපානය<br><br>ඕස්ට්‍රේලියාව |
| ජී. රත්නාවලී මෙය<br>සංවර්ධන නිලධාරී | 2017Seminar on Regional Economic Cooperation for Developing countries, | මාර්තු 10 සිට 30 දක්වා<br>2017. | චීනය |
| භාෂිණී සමරසිංහ මිය<br>සංවර්ධණ නිලධාරී | Second Health sector Development Project-Training on Planning and Management of Health Project, | ජුනි 6 සිට14 දක්වා2017 | බැංකොක්,<br>තායිලන්තය |

## 6. මූල්‍ය කාර්ය සාධනය -2017

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට අදාලව විගනකාධිපති වෙත ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල සඳහන් පරිදි වෙන් කරන ලද ප්‍රතිපාදන සහ මුළු වියදම, පුනරාවර්තන සහ මූලධන වශයෙන් පහත පරිදි සාරාංශ කළ හැක.

| වැඩසටහනෙ හි නම | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | සත්‍ය වියදම (රුපියල්) | වියදමෙ හි ප්‍රතිශත ය (%) | මුළු ප්‍රතිපාදනය (රුපියල්) | සත්‍ය වියදම (රුපියල්) | වියදමෙ හි ප්‍රතිශත ය (%) |
| පුනරාවර්තන | 88,163,000.00 | 76,640,316.74 | 86.93 | 85,222,000.00 | 82,820,601.00 | 97.18 |
| මූලධන | 6,873,458.00 | 5,836,839.39 | 84.92 | 10,223,000.00 | 6,273,910.00 | 61.37 |
| එකතුව | **95,036,458.00** | **82,477,156.13** | **86.78** | **95,445,000.00** | **89,094,511.00** | **93.35** |